# අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2018

## 32 - ව්‍යාපාර අධ්‍යයනය

අභිමතාර්ථ : ව්‍යාපාර අධ්‍යයනය විෂය නිර්දේශයෙන් අපේක්ෂිත අභිමතාර්ථ ඉටු වී ඇති අකාරය තක්සේරු කිරීමට හැකිවන පරිදි මෙන්ම විෂය දැනුම, අවබෝධය, භාවිතය, විශ්ලේෂණය හා සංස්ලේෂණය හැකියාවන් වඩාත් හොඳින් ඇගයීමට ලක් කිරීමට හැකිවන අයුරින් ප්‍රශ්න හා ගැටළු මෙම ප්‍රශ්න පත්‍රයේ අඩංගු කර ඇත.

ලකුණු පිරිනමන ආකාරය

ව්‍යාපාර අධ්‍යයනය I.

| | | | |
|---|---|---|---|
| බහුවරණ 30 යි. | ලකුණු 02 බැගින් | - | 60 |
| හිස්තැන් පිරවීම 10 | ලකුණු 02 බැගින් | - | 20 |
| නිශ්චිත කෙටි පිළිතුරු 10 | ලකුණු 02 බැගින් | - | 20 |
| | | | 100 |

ව්‍යාපාර අධ්‍යයනය II.

අ. කොටස - ප්‍රශ්න 04 යි

ආ. කොටස - ප්‍රශ්න 04 යි

එක් කොටසකින් ප්‍රශ්න 02 ක් වත් තෝරා ගෙන ප්‍රශ්න 05 කට පිළිතුරු සැපයිය යුතු ය.

1 සිට 8 දක්වා ප්‍රශ්න 08 යි. සෑම ප්‍රශ්නයක්ම කොටස් 05 කින් යුක්තවේ.

කොටසකට ලකුණු 04 බැගින් ප්‍රශ්නයකට ලකුණු 20 යි.

මුළු ලකුණු ප්‍රශ්න 05 ට ලකුණු 20 බැගින් - 100

| | | | |
|---|---|---|---|
| I හා II පත්‍රය සඳහා | | - | 200 |
| අවසාන ලකුණ | — 200 ÷ 2 | - | 100 |

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2018 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2018 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2018

2018.08.09/ 0830 - 1030

| | | |
|---|---|---|
| ව්‍යාපාර අධ්‍යයනය I<br>வணிகக் கல்வி I<br>Business Studies I | 32 S I | පැය දෙකයි<br>இரண்டு மணித்தியாலம்<br>Two hours |

**උපදෙස්:**

* **සියලු** ම ප්‍රශ්නවලට පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේ** ම සපයන්න.
* **විභාග අංකය**, ඉහළින් ඇති කොටුවේ පැහැදිලි ව සටහන් කරන්න.
* ප්‍රශ්න අංක **1** සිට **30** තෙක් වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු තෝරා, එහි අංකය ප්‍රශ්නය ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියන්න.
* ප්‍රශ්න අංක **31** සිට **50** තෙක් වූ ප්‍රශ්නවලට කෙටි පිළිතුරු අදාළ තිත් ඉරි මත ලියන්න.
* සෑම ප්‍රශ්නයකට ම ලකුණු **දෙක** බැගින් හිමි වේ.

විභාග අංකය : ..................................

**පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි.**

| I පත්‍රය සඳහා | |
|---|---|
| ප්‍රශ්න අංක | ලකුණු |
| 01 - 30 | |
| 31 - 50 | |
| එකතුව | |

| | අත්සන | සංකේත අංකය |
|---|---|---|
| 1 වන පරීක්ෂක | | |
| 2 වන පරීක්ෂක | | |
| අති. ප්‍රධාන පරීක්ෂක | | |
| ප්‍රධාන පරීක්ෂක | | |
| ගණිත පරීක්ෂක | | |

**1.** මිනිස් අවශ්‍යතා හා වුවමනා පිළිබඳ නිවැරදි ප්‍රකාශය කුමක් ද?
(1) පුද්ගලයෙකුට අවශ්‍යතා අසීමිත ප්‍රමාණයක් ඇති අතර වුවමනා ඇත්තේ සීමිත ප්‍රමාණයක් වේ.
(2) ව්‍යාපාරිකයකුට අවශ්‍යතා නිර්මාණය කළ හැකි අතර වුවමනා නිර්මාණය කළ නොහැකි වේ.
(3) අවශ්‍යතා පොදුවන අතර වුවමනා පුද්ගලයාගෙන් පුද්ගලයාට වෙනස් වේ.
(4) ආදරය, ආහාර, ආරක්ෂාව, කාර්මික අධ්‍යාපනය අවශ්‍යතාවලට නිදසුන් කිහිපයක් වේ.
(5) වුවමනා තෘප්තිමත් කර ගැනීමට පුද්ගලයෙකු යම් නිෂ්පාදිතයක් තෝරා ගැනීම අවශ්‍යතාව වේ. (......)

**2.** ඕනෑම සංවිධානයකට පොදු **නොවන** ලක්ෂණයක් වන්නේ,
(1) සම්පත් භාවිතා කිරීම ය.
(2) මිනිස් අවශ්‍යතා හා වුවමනා ඉටු කිරීම ය.
(3) භාණ්ඩ හෝ සේවා සැපයීම ය.
(4) ලාභ ඉපැයීමේ අභිප්‍රායක් තිබීම ය.
(5) රජයේ ප්‍රතිපත්ති හා නීතිරීතිවලට අනුගත වීම ය. (......)

**3.** නිෂ්පාදිත වර්ගීකරණයේ ගලායෑම හා එයට අදාළ උදාහරණය නිවැරදිව දක්වා ඇති පිළිතුර කුමක් ද?
(1) ස්පෘශ්‍ය → භාණ්ඩ → කල් නොපවතින - මෝටර් වාහන
(2) ස්පෘශ්‍ය → භාණ්ඩ → පාරිභෝගික සේවා - ප්‍රවාහනය
(3) අස්පෘශ්‍ය → සේවා → සෘජු සේවා - බැංකු
(4) අස්පෘශ්‍ය → භාණ්ඩ → භාවිතය අනුව - ගෘහ භාණ්ඩ
(5) ස්පෘශ්‍ය → භාණ්ඩ → භාවිතය අනුව - රක්ෂණය (......)

**4.** ව්‍යාපාර පරිසර බලවේග, සාධක හා ඒවායේ බලපෑම නිවැරදිව සඳහන් කර ඇති ප්‍රකාශය කුමක් ද?
(1) ව්‍යාපාරයක පරිගණක ක්‍රියාකරුවන් අභ්‍යන්තර සාධකයක් වන අතර ඔවුන්ගේ කුසලතා අඩුකම ව්‍යාපාරයට තර්ජනයක් වේ.
(2) තරගකරුවන් වැඩි වීම ව්‍යාපාරයට තර්ජනයක් වන අතර එය ආසන්න බාහිර පරිසර බලවේගයක් වේ.
(3) විදේශ විනිමය අනුපාතය පහත වැටීම අපනයනකරුවන්ට අවස්ථාවක් වන අතර එය ආසන්න බාහිර පරිසර බලවේගයක් වේ.
(4) මූල්‍ය ආයතන සාර්ව පරිසර බලවේගයක් වන අතර ඔවුන්ගේ ඇඩි තරගකාරිත්වය ව්‍යාපාරවලට අවස්ථාවක් වේ.
(5) සංවිධාන ව්‍යුහය තුළ සන්නිවේදනය නිසි පරිදි සිදු වීම සංවිධානයට ශක්තියක් වන අතර එය ආසන්න බාහිර පරිසර බලවේගයක් වේ. (......)

5. පාරිභෝගික ආරක්ෂණය තුළින් ලැබෙන ප්‍රතිලාභ කිහිපයක් පහත දැක්වේ.

A - ගෙවන මුදලට සරිලන වටිනාකමක් ඇති භාණ්ඩ පරිභෝජනය කිරීමට හැකි වීම
B - පාරිභෝගික විශ්වාසය දිනා ගැනීමට හැකි වීම
C - භාණ්ඩයේ ප්‍රවර්ධන පිරිවැය අඩු කර ගැනීමට හැකි වීම
D - භාණ්ඩයේ ප්‍රමිතිය තහවුරු කර ගැනීමට හැකි වීම
E - විකුණුම් පිරිවැටුම වැඩි කර ගැනීමට හැකි වීම
F - වෙළෙඳ විෂමාචාරවලට එරෙහි වීමට හැකි වීම

ඉහත දැ අකුරෙන් ව්‍යාපාරිකයකුට පමණක් ලැබෙන ප්‍රතිලාභ ඇතුළත් පිළිතුර කුමක් ද?

(1) ABC (2) ADF (3) BCE (4) BCF (5) BDF (......)

6. නිමල් හා කමල් හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යන නමුත් ඔවුන් අතර හවුල් ගිවිසුමක් නොතිබුණි. පසුගිය වසරේදී ඔවුන් විසින් යෙදූ ප්‍රාග්ධනයට මෙන්ම අමතරව යෙදූ ණය මුදල්වලට ද 5% ක පොලියක් ලබාගෙන ඇති අතර නිමල් තම මිතුරෙකු වූ සුනිල්ව තුදෙක් සිය කැමැත්ත මත පමණක් හවුල්කරුවෙකු ලෙස සම්බන්ධ කර ගන්නා ලදී. කමල් ප්‍රධාන විධායක නිලධාරී වශයෙන් තමන්ට දැනට ලැබෙන වැටුප ප්‍රමාණවත් නොවන බව පවසා එය වැඩි කිරීමට ඉල්ලීමක් කර ඇත.
ඉහත සිද්ධියේ දැක්වෙන පරිදි මෙම හවුල් ව්‍යාපාරය හවුල් ව්‍යාපාර ආඥා පනතට අනුව උල්ලංඝනය කර ඇති කොන්දේසි ගණන කොපමණ ද?

(1) එකකි. (2) දෙකකි. (3) තුනකි. (4) හතරකි. (5) කිසිවක් නැත.(......)

7. ඇපයෙන් සීමිත සමාගමක ලක්ෂණයක් **නොවන්නේ**,

(1) මහජනතාවට කොටස් නිකුත් කිරීමක් සිදු නොකිරීම ය.
(2) අවම වශයෙන් සාමාජිකයින් දෙදෙනෙකුවත් සිටීම ය.
(3) ලාභාංශ බෙදාහැරීමක් සිදු නොකිරීම ය.
(4) ලාභ අභිප්‍රායෙන් ආරම්භ කිරීම ය.
(5) සමාගම ඈවර කිරීමේදී එක් එක් සාමාජිකයා දායක විය යුතු මුදල සාංගමික ව්‍යවස්ථාවලියේ සඳහන් කිරීම ය. (......)

8. සමුපකාර සමිතියක් ලියාපදිංචි කිරීමේදී සමුපකාර සංවර්ධන කොමසාරිස් වෙත ඉදිරිපත් කිරීමට අවශ්‍ය **නොවන්නේ**,

(1) අතුරු ව්‍යවස්ථාවේ පිටපත් දෙකක් ය.
(2) යෝජිත ආර්ථික කටයුතුවල යෝග්‍යතා වාර්තාව ය.
(3) යෝජනා සම්මත වූ වාර්ෂික මහා සභා වාර්තාව ය.
(4) සමිතිය පිහිටි ස්ථානයට ළඟාවන මාර්ග සිතියම ය.
(5) ඉල්ලුම් පත්‍රයට අත්සන් තැබූ සාමාජිකයින්ගේ පෞද්ගලික තොරතුරු ය. (......)

9. සිසිල් විධිමත් සැලසුම්කරණයට වඩා තම හැකියා මත විශ්වාසය තබා ඇති අතර අසීරු කාර්යයක් වුවත් ආරම්භ කර අඛණ්ඩව ක්‍රියාත්මක කරගෙන යාමට හැකියාවක් ඇත්තෙකි. ඔහු ව්‍යාපාරයේ පරමාර්ථ ඉටු කර ගැනීමට නව අදහස් මත කටයුතු කරයි.
ඉහත තොරතුරු අනුව සිසිල් සතු ව්‍යවසායකත්ව නිපුණතා සංඛ්‍යාව,

(1) 1 කි. (2) 2 කි. (3) 3 කි. (4) 4 කි. (5) 5 කි. (......)

10. සුළු පරිමාණ ව්‍යාපාර අසාර්ථක වීමට බලපෑනු ලබන සාධක කිහිපයක් පහත දැක්වේ.

A - දැඩි තරගකාරිත්වය
B - නිවැරදිව ගිණුම් පවත්වාගෙන නොයෑම
C - යටිතල පහසුකම් ප්‍රමාණවත් නොවීම
D - නිවැරදි සේවකයින් බඳවා නොගැනීම
E - නව නිෂ්පාදිත කරා යොමු නොවීම
F - කර්මාන්තයේ නිෂ්පාදන තාක්ෂණය වෙනස් වීම
G - ව්‍යාපාර කාර්යඵල විශ්ලේෂණය නොකිරීම
H - රජයේ බදු සහන අඩු කිරීම

ඉහත දැ අකුරෙන් සුළු පරිමාණ ව්‍යවසායකයකුට පාලනය කළ හැකි සාධක පමණක් ඇතුළත් පිළිතුර කුමක් ද?

(1) ACEH (2) ACFH (3) BCDG (4) BDEF (5) BDEG (......)

**11.** මෙහි දැක්වෙන වගුවේ **X** තීරුව මගින් විවිධ මුදල් වර්ග ද, **Y** තීරුව මගින් ඊට අදාළ නිදසුන් කිහිපයක් ද දැක්වේ.

| X | Y |
|---|---|
| A. විද්‍යුත් මුදල් | 1. භාණ්ඩාගාර බිල්පත |
| B. ආසන්න මුදල් | 2. රත්‍රං |
| C. ව්‍යවහාර මුදල් | 3. ඉල්ලුම් තැන්පත් |
| D. බැංකු මුදල් | 4. කාසි හා නෝට්ටු |
| E. ද්‍රව්‍ය මුදල් | 5. ණය කාඩ්පත් |

මුදල් වර්ග හා උදාහරණ නිවැරදිව ගළපා ඇති කාණ්ඩය තෝරන්න.

(1) A-1, B-3, C-2, D-4, E-5
(2) A-2, B-4, C-3, D-1, E-5
(3) A-2, B-1, C-4, D-3, E-5
(4) A-5, B-3, C-4, D-1, E-2
(5) A-5, B-1, C-4, D-3, E-2 (......)

**12.** වාණිජ බැංකුවක් මගින් ලබාගත හැකි ප්‍රතිලාභ හා පහසුකම් කිහිපයක් පහත දැක්වේ.

A - පොලියක් ලබා ගැනීමට හැකි වීම
B - චෙක්පත් තැන්පත් කිරීමට හැකි වීම
C - නිත්‍ය නියෝග මත ගෙවීම් කළ හැකි වීම
D - ණයපත් ලබා ගැනීමට හැකි වීම
E - අයිරා පහසුකම් ලබා ගැනීමට හැකි වීම

ඉහත දැ අතුරෙන් ඉතිරිකිරීමේ ගිණුම් හිමියෙකුට ලබා ගත හැකි ප්‍රතිලාභ හා පහසුකම් ගණන,

(1) 1 කි. (2) 2 කි. (3) 3 කි. (4) 4 කි. (5) 5 කි. (......)

**13.** බණ්ඩාර ඔහුගේ මෝටර් රථය සඳහා තෙවැනි පාර්ශ්ව රක්ෂණයක් ලබා ගෙන තිබුණි. ඔහුගේ පුතා විසින් එම වාහනය පදවාගෙන යන අවස්ථාවකදී එය නිවසක වැදී වාහනයටත් එම නිවසටත් අලාභහානි සිදු වූ අතර පුතාට ද තුවාල සිදු විය.

ඉහත සිද්ධිය අනුව රක්ෂණ වන්දි ලබාගත හැකි වන්නේ,

(1) වාහනයට පමණි. (2) නිවසට පමණි. (3) පුතාට පමණි.
(4) වාහනයට හා නිවසට පමණි. (5) නිවසට හා පුතාට පමණි. (......)

**14.** බිමල් කථා පැවැත්වීමට කැමති අයෙකි. ඔහුගේ කථා සාමාන්‍යයෙන් දිගු ය. ඔහු කථාවේදී බැරෑරුම් වචන පාවිච්චි කරන අතර සමහර විට පුද්ගලයින්ට ද අපහාස කරයි. ඔහු තමාගේ මතය දැඩි විශ්වාසයකින් ඉදිරිපත් කරන නමුත් ඇතැම් තොරතුරු සාවද්‍ය වේ. කෙසේ වුවත් ඔහුගේ කථා විලාසය සිත් ඇදගන්නා සුළු ය.

ඉහත විස්තර අනුව බිමල් විසින් කඩකරන්නා වූ සඵලදායී සන්නිවේදනයක ගුණාංග සංඛ්‍යාව,

(1) 1 කි. (2) 2 කි. (3) 3 කි. (4) 4 කි. (5) 5 කි. (......)

**15.** පහත වගුවේ **X** තීරුවේ විද්‍යුත් මාධ්‍ය හරහා කරනු ලැබූ ව්‍යාපාර ක්‍රියාකාරකම් කිහිපයක් ද, **Y** තීරුවේ විද්‍යුත් වෙළෙඳ ආකෘති කිහිපයක් ද දැක්වේ.

| X | Y |
|---|---|
| A - ආගමන විගමන දෙපාර්තමේන්තුව විදේශ ගමන් බලපත් සඳහා ඉල්ලුම් පත් භාර ගැනීම | 1. B2 C |
| B - **M** සමාගම **S** සමාගමට සහල් තොග අලෙවි කිරීම | 2. C2 C |
| C - ගුවන් ගමන් නියෝජිතයෙකු විසින් සමන්ට ගුවන් ටිකට්පතක් අලෙවි කිරීම | 3. B2 G |
| D - සීමාසහිත **A** සමාගම රාජ්‍ය සංස්ථාවකට පරිගණක සැපයීම | 4. G2 C |
| E - **R** විසින් තමාගේ ඉඩම **D** නමැති පුද්ගලයාට විකිණීම | 5. B2 B |

විද්‍යුත් ව්‍යාපාර ක්‍රියාකාරකම් හා විද්‍යුත් වෙළෙඳ ආකෘති නිවැරදි ලෙස ගළපා ඇති පිළිතුර තෝරන්න.

(1) A-1, B-3, C-2, D-4, E-5 (2) A-2, B-4, C-3, D-1, E-5
(3) A-3, B-5, C-1, D-4, E-2 (4) A-4, B-5, C-1, D-3, E-2
(5) A-5, B-4, C-1, D-2, E-3 (......)

**16.** කළමනාකරණයට හා කළමනාකරණ ක්‍රියාවලියේ කාර්යයන්ට (functions) අදාළ **වඩාත්** නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) කිසියම් ගැටලුවකට ගනු ලැබූ නිශ්චිත විසඳුමක් ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය 'කළමනාකරණය' වේ.
(2) ආයතනයක පරමාර්ථ හා අරමුණු ඉටු කර ගැනීමට ගනු ලබන පියවර ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය 'සැලසුම්කරණය' වේ.
(3) ආයතනයක පරමාර්ථ හා අරමුණු ඉටුකර ගැනීමට සම්පත් බෙදාහැරීමේ ක්‍රියාවලිය 'සංවිධානකරණය' වේ.
(4) ආයතනයක පරමාර්ථ හා අරමුණු ඉටුකර ගැනීම සඳහා සේවකයින්ට බලපෑම් කිරීමේ ක්‍රියාවලිය 'මෙහෙයවීම' වේ.
(5) ආයතනයක පරමාර්ථ හා අරමුණු ඉටුකර ගන්නා ආකාරයට, සැලසුම්ගත හා සත්‍ය ප්‍රතිඵල අතර වෙනස්කම් නිවැරදි කිරීමට පියවර ගැනීමේ ක්‍රියාවලිය 'පාලනය' වේ. (......)

[ හතරවැනි පිටුව බලන්න.

**17.** පහත වගුවේ **X** තීරුව මගින් තීරණ ගැනීමේ පියවර ද, **Y** තීරුව මගින් කිසියම් ආයතනයකට සම්බන්ධව එම පියවරවලට අදාළ තොරතුරු ද දැක්වේ.

| X | Y |
|---|---|
| A. ගැටලුව හඳුනා ගැනීම | 1. සේවා ප්‍රවර්ධන අංශයක් ස්ථාපිත කිරීම |
| B. විකල්ප විසඳුම් හඳුනා ගැනීම | 2. අලෙවියෙන් පසු සේවා සැපයුම් ප්‍රවර්ධනය |
| C. විකල්ප ඇගයීම | 3. විවිධ පාර්ශ්වයන්ගෙන් යෝජනා කැඳවීම |
| D. හොඳම විකල්පය තෝරා ගැනීම | 4. පාරිභෝගික වුවමනා තෘප්තිමත් කිරීමට අපොහොසත් වීම |
| E. තීරණය ක්‍රියාත්මක කිරීම | 5. දෙන ලද යෝජනා කළමනාකරණ කමිටුවක විශ්ලේෂණය කිරීම |

තීරණ ගැනීමේ පියවර හා ඊට අදාළ තොරතුරු නිවැරදිව ගළපා ඇති පිළිතුර තෝරන්න.

(1) A-1, B-2, C-4, D-3, E-5 (2) A-2, B-1, C-3, D-5, E-4
(3) A-4, B-3, C-5, D-2, E-1 (4) A-4, B-2, C-3, D-1, E-5
(5) A-5, B-1, C-4, D-3, E-2 (……)

**18.** ඉවත්ව යාමේ සම්මුඛ පරීක්ෂණයේදී කළමනාකරුවෙකු විසින් ඉදිරිපත් කළ ප්‍රකාශය අනුව ඔහු ආයතනයෙන් ඉවත්වීමට බලපෑ ප්‍රධාන හේතුව වන්නේ, වැටුප ප්‍රමාණවත් නොවීම, විශාල සේවක සංඛ්‍යාවකගේ වැඩ අධීක්ෂණය කිරීමට සිදු වීම, එකවර විවිධ පාර්ශ්වයන්ගෙන් විධාන ලැබීම, තීරණ ගැනීමට නිදහසක් නොමැති වීම හා අවිධිමත් සම්බන්ධතා ප්‍රබල වීම හේතුවෙන් විධිමත් අධිකාරිත්වය ස්ථාපිත නොවීම වැනි කරුණු නිසා ඇති වූ මානසික ආතතියයි.

ඉහත ප්‍රකාශයට අනුව මෙම ආයතනයේ සංවිධානකරණයට අදාළ දුර්වලතා සංඛ්‍යාව,

(1) 1 කි. (2) 2 කි. (3) 3 කි. (4) 4 කි. (5) 5 කි. (……)

**19.** 'ක්‍රියාවලි පිරියත' යන්න නිවැරදිව විස්තර කෙරෙන ප්‍රකාශය තෝරන්න.

(1) සමාන ශ්‍රිත හෝ ක්‍රියාවලි පදනම් කරමින් සිදු කරන පිරියතයි.
(2) නිෂ්පාදන කාර්යයන් රේඛීයව ගලා යන ක්‍රමයට පදනම්ව සකස් වී ඇති පිරියතයි.
(3) කොටසක් රේඛීයව ගලා යන ක්‍රමයටත්, තව කොටසක් නම්‍ය ලෙස ගලා යන ක්‍රමයටත් පදනම්ව සකස් වී ඇති පිරියතයි.
(4) සමාන යන්ත්‍ර හා විෂම යන්ත්‍ර වෙන වෙන ම කුටිවල සවි කර සකස් වී ඇති පිරියතයි.
(5) නිෂ්පාදනය සිදු කරන නිශ්චිත ස්ථානයට සියලුම උපකරණ හා අවශ්‍ය සෙසු ද්‍රව්‍ය ගෙනවිත් සකස් කෙරෙන පිරියතයි. (……)

**20.** පහත සඳහන් වන්නේ තොග සම්බන්ධ වියදම් කිහිපයකි.

A - ගබඩා වියදම් E - පරීක්ෂා කිරීමේ වියදම්
B - තොග හානිවීම් F - ආරක්ෂක වියදම්
C - රක්ෂණ ගාස්තු G - මිල දී ගැනීමේ පිරිවැය
D - ගෙන ඒමේ වියදම් H - තොග හිඟ වීමේ පිරිවැය

ඉහත සඳහන් ඒ අතුරෙන් තොග පවත්වා ගැනීමට අදාළ වියදම් පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) ABCF (2) ABCH (3) BCDE (4) BCFH (5) CDEG (……)

**21.** පහත දැක්වෙන්නේ ඵලදායිතාව වැඩි කර ගැනීමට අනුගමනය කළ හැකි යැයි කළමනාකරුවන් විසින් අදහස් කෙරෙන ක්‍රම කිහිපයකි.

A - නව තාක්ෂණය භාවිත කිරීම E - නිෂ්පාදිත විවිධාංගීකරණය කිරීම
B - සහභාගීත්ව තීරණ ගැනීම හඳුන්වා දීම F - සේවක සුභසාධන වියදම් අඩු කිරීම
C - සේවක කප්පාදුව G - නිෂ්පාදිතවල ලාභාන්තිකය වැඩි කිරීම
D - සම්පත් නාස්තිය අවම කිරීම

ඉහත දැ අතුරෙන් ඵලදායිතාව වැඩි කර ගැනීමට යෝග්‍ය **නොවන** ක්‍රම මොනවා ද?

(1) ABC (2) CDE (3) CFG (4) DEF (5) DFG (……)

**22.** ආයුර්වේදීය දන්තාලේප නිෂ්පාදකයකුගේ අදහස අනුව සිය නිෂ්පාදිත ස්වාභාවික වර්ණයකින්, රසයකින්, පෙනුමකින් මෙන් ම ඉහළ ගුණාත්වයකින් ද සමන්විත විය යුතු ය. මෙම අදහසට වඩාත් ම ගැළපෙන අලෙවිකරණ සංකල්පය කුමක් ද?

(1) නිෂ්පාදන සංකල්පය (2) නිෂ්පාදිත සංකල්පය (3) විකුණුම් සංකල්පය
(4) අලෙවිකරණ සංකල්පය (5) සාකල්‍යවාදී අලෙවිකරණ සංකල්පය (……)

PAST PAPERS WIKI

**23.** පහත දැක්වෙන්නේ මූල්‍ය අනුපාත කිහිපයක් ගණනය කරනු ලබන ආකාරය වේ.

A - ආයෝජන මත ප්‍රතිලාභ අනුපාතය $= \dfrac{\text{බදු පසු ශුද්ධ ලාභය + පොලිය}}{\text{ස්ථාවර වත්කම්}} \times 100$

B - හිමිකම් ප්‍රාග්ධනය මත ප්‍රතිලාභ අනුපාතය $= \dfrac{\text{බදු පසු ශුද්ධ ලාභය + වරණීය ලාභාංශ}}{\text{හිමිකම් ප්‍රාග්ධනය}} \times 100$

C - මුළු වත්කම් පිරිවැටුම් අනුපාතය $= \dfrac{\text{විකුණුම්}}{\text{මුළු වත්කම්}}$

D - ණයගැති පිරිවැටුම් අනුපාතය $= \dfrac{\text{විකුණුම්}}{\text{සාමාන්‍ය ණයගැතියෝ}}$

E - ජංගම අනුපාතය $= \dfrac{\text{ජංගම වත්කම්}}{\text{ජංගම වගකීම්}}$

ඉහත ද අතුරෙන් නිවැරදිව ගණනය කර ඇති අනුපාත ගණන,

(1) 1 කි. (2) 2 කි. (3) 3 කි. (4) 4 කි. (5) 5 කි. (......)

**24.** පහත වගුවේ **X** තීරුව මගින් කොළඹ කොටස් හුවමාරුවේ ගනුදෙනු වන සුරැකුම්පත් වර්ග කිහිපයක් ද, **Y** තීරුව මගින් ඒවා සඳහා ලැබෙන ප්‍රතිලාභ ද දැක්වේ.

| X | Y |
|---|---|
| A. සාමාන්‍ය කොටස් | 1. ප්‍රාග්ධන ලාභ ලබා ගැනීමට හැකි වීම |
| B. වරණීය කොටස් | 2. ස්ථිර පොලී ප්‍රතිශතයක් හිමි වීම |
| C. කොටස් බලපත්‍ර | 3. සමාගමේ අයිතිය හිමි වීම |
| D. සාංගමික ණයකර | 4. ආයෝජනයට වැඩි ආරක්ෂාවක් ලැබීම |
| E. රජයේ ණය සුරැකුම්පත් | 5. ස්ථිර ලාභ ප්‍රතිශතයක් ලැබීම |

සුරැකුම්පත් වර්ග හා ප්‍රතිලාභ නිවැරදිව ගළපා ඇති පිළිතුර තෝරන්න.

(1) A-1, B-3, C-2, D-4, E-5
(2) A-3, B-2, C-1, D-5, E-4
(3) A-3, B-5, C-1, D-2, E-4
(4) A-2, B-3, C-1, D-5, E-4
(5) A-4, B-5, C-2, D-1, E-3

(......)

**25.** මානව සම්පත් කළමනාකරණයට අදාළ **වඩාත්** නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) නිශ්චිත අරමුණක් ඉටු කිරීම සඳහා ආයතනයේ වැඩ ඒකකවලට බෙදීම රැකියා නිර්මාණය වේ.
(2) රැකියාවක ලක්ෂණ පිළිබඳව ක්‍රමානුකූල අධ්‍යයනයක් කිරීම රැකියා විශ්ලේෂණය වේ.
(3) සේවකයකුගේ සුදුසුකම් විස්තර කෙරෙන ප්‍රකාශය රැකියා විස්තරය වේ.
(4) කිසියම් රැකියාවක් තුළ පවතින ගුණාංග විස්තර කෙරෙන ප්‍රකාශය රැකියා පිරිවිතරය වේ.
(5) රැකියා පිරිවිතරය හා රැකියා විස්තරය සකස් කිරීමට පදනම් වන්නේ රැකියා විශ්ලේෂණය වේ. (......)

**26.** සේවක ආකර්ෂණ ක්‍රම තුළින් ඇති විය හැකි වාසි හා අවාසි කිහිපයක් පහත දැක්වේ.

A - සේවකයින් අභිප්‍රේරණය වීම
B - සේවකයින් රඳවා ගැනීමට පහසු වීම
C - ආකර්ෂණ පිරිවැය අඩු වීම
D - නව දැනුම ආයතනයට ලබා ගැනීමට හැකි වීම
E - සේවකයන් අතර තරගයක් ඇති වීම
F - විශාල අයදුම්පත් සංඛ්‍යාවක් ලබා ගැනීමට හැකි වීම
G - සේවක කැපවීම වැඩි වීම
H - සේවක අනුස්ථාපන පුහුණු වියදම් වැඩි වීම

ඉහත ද අතුරෙන් අභ්‍යන්තර ආකර්ෂණය මගින් විය හැකි වාසි පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) ABCG (2) ACDG (3) BCGH (4) CEFG (5) DEFH (......)

**27.** ගුවන් නියමුවකු ලෙස පුහුණුවන්නකුට ප්‍රායෝගික පුහුණුව ලබා දීම සඳහා වඩාත් ම යෝග්‍ය පුහුණු කිරීමේ ක්‍රමය වන්නේ,

(1) දේශන හා සාකච්ඡා ය.
(2) සමාකරණ පුහුණුව ය.
(3) සීමාවාසික පුහුණුව ය.
(4) භූමිකා රංගනය ය.
(5) ආධුනික පුහුණුව ය.

(......)

28. පහත වගුවේ X තීරුව මගින් තොරතුරු පද්ධතියක උපාංග ද Y තීරුව මගින් ඊට අදාළ නිදසුන් ද දැක්වේ.

| X | Y |
|---|---|
| A. දෘඪාංග | 1. සේවක අර්ථසාධක අරමුදල් ලිපි ගොනුව |
| B. මෘදුකාංග | 2. පරිගණක ක්‍රියාකරු |
| C. ජීවාංග | 3. ක්‍රියාකාරී පද්ධතිය |
| D. දත්ත | 4. අනුමත කළ දත්ත පමණක් ඇතුළත් කිරීම |
| E. ක්‍රියාපටිපාටි | 5. යතුරු පුවරුව |

උපාංග හා නිදසුන් නිවැරදිව ගළපා ඇති පිළිතුර තෝරන්න.

(1) A-1, B-3, C-2, D-4, E-5
(2) A-2, B-4, C-5, D-3, E-1
(3) A-3, B-1, C-4, D-2, E-5
(4) A-5, B-3, C-1, D-4, E-2
(5) A-5, B-3, C-2, D-1, E-4 (……)

29. විද්‍යුත් (ඉලෙක්ට්‍රොනික්) තාක්ෂණය උපයෝගී කරගත් ව්‍යාපාර සම්බන්ධව දැක්වෙන නිවැරදි ප්‍රකාශය කුමක් ද?

(1) විද්‍යුත් ව්‍යාපාර විද්‍යුත් වාණිජ්‍යයේ උපකුලකයකි.
(2) විද්‍යුත් වාණිජ්‍යය හා විද්‍යුත් අලෙවිකරණය යනු එකම දෙයකි.
(3) විද්‍යුත් ව්‍යාපාර හා විද්‍යුත් වාණිජ්‍යය අතර සම්බන්ධයක් නැත.
(4) විද්‍යුත් වාණිජ්‍යය හා විද්‍යුත් ව්‍යාපාර යනු එකම දෙයකි.
(5) විද්‍යුත් වාණිජ්‍යය හා විද්‍යුත් අලෙවිකරණය විද්‍යුත් ව්‍යාපාරයේ උපකුලක වේ. (……)

30. ව්‍යාපාර සැලසුමක අංගයක් නිවැරදිව විස්තර කෙරෙන ප්‍රකාශය තෝරන්න.

(1) කරගකාරී හා වෙළඳපොළ අත්පත් කර ගැනීමේ (විනිවිදයාමේ) උපායමාර්ග අඩංගු වන්නේ නිෂ්පාදන සැලැස්මෙහි ය.
(2) අවශ්‍ය සම්පත් ප්‍රමාණය හා නිෂ්පාදන ප්‍රමිති අඩංගු වන්නේ මෙහෙයුම් සැලැස්මෙහි ය.
(3) අවශ්‍ය මානව සම්පත අඩංගු වන්නේ මූල්‍ය සැලැස්මෙහි ය.
(4) අවශ්‍ය සියලු ම ඇස්තමේන්තුගත තොරතුරු අඩංගු වන්නේ අලෙවි සැලැස්මෙහි ය.
(5) ව්‍යාපාර උපායමාර්ග හා සංවිධාන ව්‍යුහය විස්තර කෙරෙන්නේ මානව සම්පත් සැලැස්මෙහි ය. (……)

- අංක **31** සිට **40** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේදී **සුදුසු වචන** යොදා හිස්තැන් පුරවන්න.

31. (අ) ශ්‍රම විභජනයෙහි ප්‍රතිඵලයක් ලෙස පුද්ගල …………………………… ඇති වන අතර අතිරික්ත නිෂ්පාදන හුවමාරුව තුළින් …………………………… බිහි වේ.

(ආ) අයිතිකරුවන්ගේ වටිනාකම් හා විශ්වාසය මත සංවිධාන …………………………… ගොඩනැගෙන අතර එහි නොගැළපීම සංවිධානයට …………………………… වේ.

32. (අ) තිරසාර සංවර්ධනය මූලික කරගත් ව්‍යාපාර ආයතන විසින් ලාභය මෙන් ම …………………………… හා …………………………… පිළිබඳව ද සැලකිලිමත් විය යුතු ය.

(ආ) නිෂ්පාදනයේ සිට බෙදාහැරීම දක්වා ඇති සෑම අදියරේදී ම වර්ධක අගය මත අය කරන බද්ද …………………………… වන අතර සේවා නියුක්තිකයෙකුගේ පාරිශ්‍රමිකය (ලාභය) මත අය කරන බද්ද …………………………… වේ.

33. (අ) තේවල ස්වාමි ව්‍යාපාරයක හිමිකරු …………………………… ට තනිව මුහුණ දෙන අතර ව්‍යාපාරයේ …………………………… මත බද්ද ගෙවයි.

(ආ) හවුල්කරුවන්ට ව්‍යාපාරයේ වෙළෙඳ කටයුතුවලට සහභාගීවීමේ …………………………… ඇති අතර ව්‍යාපාර කටයුතුවලට උනන්දුවෙන් සහභාගීවීමේ …………………………… ද ඇත.

34. (අ) අවදානමක් දරමින් …………………………… ඇති කරන පුද්ගලයා ව්‍යවසායකයකු වන අතර ඔහු සෑම විටම …………………………… නොවේ.

(ආ) බලපත්‍රලාභී වාණිජ බැංකුවලට මුදල් …………………………… හැකි අතර මුදල් …………………………… කළ නොහැකි ය.

[ හත්වැනි පිටුව බලන්න.

**35.** (අ) රක්ෂණ ගිවිසුමක ක්‍රියාකාරිත්වය තුළින් මතුවන බාහිර පක්ෂය .................................... පාර්ශ්වය වන අතර සේවයේ යෙදී සිටියදී සේවකයින්ට සිදුවන අනතුරු සඳහා වන්දි ගෙවීමට සේව්‍ය පක්ෂය විසින් ලබා ගන්නා රක්ෂණය.................................. රක්ෂණය වේ.

(ආ) ප්‍රවාහන පද්ධතියට අයත් මූලිකාංග අතුරෙන් .................................. මූලිකාංගයට වරාය අයත් වන අතර දුම්රිය මාර්ගය .................................. මූලිකාංගයට අයත් වේ.

**36.** (අ) අදහසක් කිසියම් පණිවුඩයකට පරිවර්තනය කිරීමේ ක්‍රියාවලිය .............................. නමින් හඳුන්වන අතර පණිවුඩලාභියා විසින් එම අදහස පරිවර්තනය කරගන්නා ක්‍රියාවලිය ........................ වේ.

(ආ) මූල්‍ය සැලසුම්කරණය හා පාලනයේදී .................................. අයවැය හා .............................. අයවැය භාවිත වේ.

**37.** (අ) 'කළමනාකරණය' යන්න ගතික ව්‍යාපාර .................................... තුළ ව්‍යාපාරයේ අරමුණු සඵලදායීව හා කාර්යක්ෂමව ඉටු කර ගැනීමට ආයතනයේ.................................... මෙහෙයවීම ලෙස හැඳින්විය හැකි ය.

(ආ) අධිකාරිය ................................................ මත නීත්‍යානුකූලව ලැබෙන බලයක් වන අතර විශේෂඥ බලය ................................................ මත ලැබෙන්නකි.

**38.** (අ) අවම තොග මට්ටම = .................... මට්ටම – (සාමාන්‍ය තොග භාවිතය × සාමාන්‍ය ................ )

(ආ) මුදල් ගෙවා අපෞද්ගලිකව භාණ්ඩ හා සේවා ප්‍රවර්ධනය කිරීම .................................. වන අතර ඉලක්ක කරගත් ගනුදෙනුකරුවන් පෙළඹවීම සඳහා කරනු ලබන කෙටිකාලීන දිරිගැන්වීමේ වැඩසටහන් .................................. වේ.

**39.** (අ) දත්ත ඒවායේ ලක්ෂණ අනුව වෙන් කර ගැනීම .............................................. වන අතර අදහස් ඇති කර ගත හැකි පරිදි එම දත්ත කෙටීකර ඉදිරිපත් කිරීම.................................. වේ.

(ආ) සැලසුම් සකස් කිරීමේදී විකුණුම් ප්‍රමාණය ඇස්තමේන්තු කිරීම .................................. පුරෝකථනයට ඇතුළත් වන අතර යන්ත්‍ර උපකරණ අවශ්‍යතා .................................. සැලැස්මට අයත් වේ.

**40.** පහත සඳහන් වගන්තිවල **සත්‍ය** හෝ **අසත්‍ය** බව සඳහන් කරන්න.

| | **සත්‍ය/අසත්‍ය** |
|---|---|
| 1. දැනට සිටින සාමාන්‍ය කොටස්හිමියන්ට මුදල් අයකර කොටස් ලබාදීම ප්‍රසාද කොටස් නිකුතුව වේ. | ........................ |
| 2. මුදල් අය කිරීමෙන් තොරව ලබාදෙන කොටස්, හිමිකම් නිකුතුව වේ. | ........................ |
| 3. සිය අයිතීන් රැකගැනීමට වෘත්තීය සමිති කළමනාකාරිත්වය සමග සාකච්ඡා කිරීම සාමූහික කේවල් කිරීම වේ. | ........................ |
| 4. සාමූහික කේවල් කිරීමේ ක්‍රියාවලියකින් පසු යම්කිසි ආරවුලක් සම්බන්ධව සේව්‍ය සේවක දෙපාර්ශ්වය අතර ඇති කරගන්නා එකඟතාව සාමූහික ගිවිසුම වේ. | ........................ |

● අංක **41** සිට **50** තෙක් ප්‍රශ්නවලට **නිශ්චිත පිළිතුරු** සපයන්න.

**41.** පහසු භාණ්ඩවල ගුණාංග **හතරක්** ලියන්න.

1. ............................................ 2. ............................................
3. ............................................ 4. ............................................

**42.** ඇල්මැති පාර්ශ්වකරුවෙකු ලෙස රජය, පාසල් කෙරෙහි අවධානය යොමු කිරීමට බලපාන හේතු **හතරක්** ලියන්න.

1. ............................................ 2. ............................................
3. ............................................ 4. ............................................

**43.** පාරිභෝගිකයා සතු වගකීම් **හතරක්** සඳහන් කරන්න.

1. ............................................ 2. ............................................
3. ............................................ 4. ............................................

**44.** විද්‍යුත් (ඉලෙක්ට්‍රොනික්) ගෙවීම් පහසු කිරීම සඳහා ඇති පහසුකම් **හතරක්** ලියන්න.

1. ..........
2. ..........
3. ..........
4. ..........

**45.** චෙක්පත් ලිවීමේදී සැලකිල්ලට ගත යුතු කරුණු **හතරක්** ලියන්න.

1. .......... 2. ..........
3. .......... 4. ..........

**46.** ජාත්‍යන්තර වෙළඳාමෙහි වර්ධනයට බලපා ඇති කරුණු **හතරක්** ලියන්න.

1. ..........
2. ..........
3. ..........
4. ..........

**47.** පාලන ක්‍රියාවලියක් ආයතනයකට වැදගත් වන හේතු **හතරක්** ලියන්න.

1. ..........
2. ..........
3. ..........
4. ..........

**48.** සන්නාමයකින් යුතුව භාණ්ඩ වෙළෙඳපොළට ඉදිරිපත් කිරීමෙන් නිෂ්පාදකයෙකුට ලැබෙන වාසි **හතරක්** ලියන්න.

1. ..........
2. ..........
3. ..........
4. ..........

**49.** සාමාන්‍ය කොටස් හිමියෙකු හට ලාභාංශවලට අමතරව සමාගමකින් ලැබෙන ප්‍රතිලාභ **හතරක්** ලියන්න.

1. .......... 2. ..........
3. .......... 4. ..........

**50.** පහත සඳහන් සංකේතවලින් අදහස් කෙරෙන්නේ කුමක් ද?

1.  ..........

2.  ..........

3.  ..........

4.  ..........

* * *

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

## අ.පො.ස. (උ.පෙළ) විභාගය/ க.பொ.த. (உயர் தர)ப் பரீட்சை - 2018

විෂයය අංකය / பாட இலக்கம்: 32

විෂයය / பாடம்: ව්‍යාපාර අධ්‍යයනය

## ලකුණු දීමේ පටිපාටිය/புள்ளி வழங்கும் திட்டம்

### I පත්‍රය/பத்திரம் I

| ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. |
|---|---|---|---|---|---|
| 01. | 3 | 11. | 5 | 21. | 3 |
| 02. | 4 | 12. | 3 | 22. | 2 |
| 03. | 3 | 13. | 2 | 23. | 2 |
| 04. | 2 | 14. | 4 | 24. | 3 |
| 05. | 3 | 15. | 4 | 25. | 5 |
| 06. | 3 | 16. | 5 | 26. | 1 |
| 07. | 4 | 17. | 3 | 27. | 2 |
| 08. | 5 | 18. | 4 | 28. | 5 |
| 09. | 4 | 19. | 1 | 29. | 5 |
| 10. | 5 | 20. | 1 | 30. | 2 |

✪ විශේෂ උපදෙස්/ விசேட அறிவுறுத்தல் :

එක් පිළිතුරකට/ ஒரு சரியான விடைக்கு 02 ලකුණු බැගින්/புள்ளி வீதம்

මුළු ලකුණු/மொத்தப் புள்ளிகள் 2 × 30 = 60

31. අ. විශේෂිකරණය, වෙළෙඳාම
    ආ. සංස්කෘතිය, දුර්වලතා

32. අ. පුද්ගලයින්/ සමාජය, පරිසරය / විශ්වය (People , Plannet)
    ආ. එකතු කළ අගය මත බදු (VAT) , උපයන විට ගෙවීම් බදු (PAYE)

33. අ. අවදානම, ආදායම
    ආ. අයිතිවාසිකම, යුතුකම/ වගකීම

34. අ. නවෝත්පාදනය, ව්‍යාපරිකයෙකු / කළමනාකරුවෙකු
    ආ. මැවීමට/ මැවීම කළ, නිකුතුව/ නිකුත් කිරීම

35. අ. තෙවන, සේවායෝජක වගකීම්/ සේවා වගකීම්
    ආ. පර්යන්තය, මාර්ග

36. අ. ආකේතනය, විකේතනය
    ආ. මුදල්, ප්‍රාග්ධන

37. අ. පරිසරය, සම්පත්
    ආ. තනතුර, පුද්ගලයා

38. අ. යළි ඇණවුම් , ඇණවුම් කාලය
    ආ. ප්‍රචාරණය, විකුණුම් ප්‍රවර්ධනය/ ප්‍රවර්ධනය/ පාරිභෝගික විකුණුම් ප්‍රවර්ධනය

39. අ. වර්ගීකරණය, සාරාංශකරණය
    ආ. විකුණුම්, මෙහෙයුම්

40. 1. අසත්‍ය
    2. අසත්‍ය
    3. සත්‍ය
    4. සත්‍ය

41. 1. සුලභතාව
    2. අඩු මිල/ අඩු ලාභාන්තිකය
    3. ප්‍රචාරණ ආකර්ශනය

4. පැවැත්ම කෙටි කාලීන වීම
5. අඩු ප්‍රමාණයන්ගෙන් මිල දී ගැනීම
6. කෙටි කාලීන ගැණුම් තීරණ
7. නිතර නිතර මිලදී ගැනීම
8. විකල්ප බහුලව පැවතීම
9. පහසුවෙන් මිලදී ගත හැකි වීම
10. පුරුද්දට මිලදී ගැනීම

42. 1. අධ්‍යාපන ප්‍රමිතීන් ආරක්ෂා කිරීමට
2. ළමයින්ගේ අධ්‍යාපන අයිතීන් තහවරු කිරීමට
3. පාසල් පද්ධතියේ විනය ආරක්ෂා කිරීමට
4. සමාජ සංවර්ධනය සඳහා
5. අධ්‍යාපන ප්‍රමිතීන් සංවර්ධනය
6. අධ්‍යයන හා අනධ්‍යයන සේවක අයිතීන් තහවුරු කිරීමට
7. අධ්‍යපන පරිපාලනය සඵලදායී කිරීමට හා සම්පත් භාවිතය කාර්යක්ෂම කිරීමට

43. 1. විචාරාත්මක දැනුවත් භාවය
2. සක්‍රිය සහභාගීත්වය
3. සමාජය ගැන සැලකිලිමත් වීම
4. පරිසරය ගැන සැලකිලිමත් වීම
5. සහයෝගීතාව

44. 1. ස්වයංක්‍රිය ටෙලර් යන්ත්‍ර (ATM/ CDM)
2. වෙළෙඳසැල් ගෙවීම් විද්‍යුත් පැවරුම් ජාල (EFT POS)
3. ටෙලි බැංකු පහසුකම් (Tele Banking)
4. අන්තර්ජාල බැංකු කටයුතු (Internet Banking)

45. 1. ලිවීමේ දී නොමැකෙන තීන්ත වර්ගයක් භාවිත කළ යුතුය.
2. පිළිපතෙහි අදාළ විස්තර සටහන් කළ යුතුය
3. ලිවීමේ දී සිදුවන වැරදි තනි ඉරකින් කපා අත්කරුගේ සම්පූර්ණ අත්සන යෙදිය යුතුය
4. අණකරුගේ අත්සන නියමාකාරයෙන් යෙදිය යුතුය.

5. චෙක්පතට යොදන දිනය හා ආරක්ෂාව පිළිබඳ ව සැලකිලිමත් විය යුතු ය.

6. හිස් චෙක්පත් සඳහා අත්සන නොයෙදිය යුතුය

7. වටිනාකම ඉලක්කමෙන් හා අකුරෙන් ලිවීමේ දී වැඩි හිස්තැන් නොතබන්න

46. 1. ගෝලීයකරණය

2. තාක්ෂණික හා සන්නිවේදන දියුණුව

3. වෙළෙඳ බාධක අවම වීම

4. වෙළෙඳ ගිවිසුම් හා ජාත්‍යන්තර වෙළෙඳ සංවිධාන බිහි වීම

5. ලෝකයේ විවිධ ජාතීන් අතර ආකල්ප හා චර්යාවන් වල වෙනස්කම් අවම වීම

47. 1. නිෂ්පාදිතයේ ගුණත්වය ආරක්ෂා කරගැනීමට

2. පිරිවැය අවම කර ගැනීමට

3. වැරදි අවම කර ගැනීමට හෝ ශුන්‍ය මට්ටමකට ගෙන ඒමට

4. පරිසරයේ වෙනස්වීම්වලට අනුව ගැලපීමට

5. ආයතනයේ ප්‍රගතිය නිරීක්ෂණයට සහ වැරදි නිවැරදි කිරීමට

6. ආයතනයේ කාර්ය සාධනය අපේක්ෂිත මට්ටමින් සිදුවන බව තහවුරු කර ගැනීමට

7. විචලනයන් ක්ෂණිකවම හඳුනාගෙන නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග වලට අවතීරණ වීම පහසු වීම

48. 1. අනෙකුත් තරඟකාරී සන්නම්වලින් තම ආයතනයේ සන්නම වෙන් කොට ප්‍රවර්ධනය කළ හැකි වීම

2. ඇණවුම් ලබා ගැනීමේ පහසුව

3. නීතිමය ආරක්ෂාව

4. පාරිභෝගිකයන් අතර සන්නම් පක්ෂපාතීත්වයක් ඇති කරගත හැකි වීම

5. හොඳ සන්නමක් මගින් ආයතනයේ සමස්ත ප්‍රතිරූපය වැඩි කර ගත හැකි වීම

6. ව්‍යාපාරයට සන්නම් වටිනාකමක් නිර්මාණය වීම

7. සන්නම පාරිභෝගික මනසෙහි ස්ථාපිත කළ හැකි වීම

49. 1. හිමිකම් නිකුතුව

2. ප්‍රාග්ධනලාභ

3. සංචිත ප්‍රාග්ධනීකරණය

4. ඡන්ද බලය හිමිවීම

5. ඇප සුරැකුම් ලෙස භාවිත කළ හැකි වීම

50. 1. මුහුණුපොත (Face book)

2. ට්විටර් (Twitter)

3. ප්‍රතිචක්‍රීකරණය (Recycling)

4. විශේෂ අවශ්‍යතා ඇති පුද්ගලයන් සඳහා පහසුකම් ඇති බව

## I කොටස

1. (i) (අ) අවශ්‍යතා, වුවමනා සහ නිෂ්පාදිත යන පද නිර්වචනය කර, ඒවා අතර පවතින සම්බන්ධතාව පැහැදිලි කරන්න.

අවශ්‍යතාව - මිනිසාට ජීවත් වීම සඳහා පැවතිය යුතු මූලික දෑ

වුවමනා - අවශ්‍යතා තෘප්තිමත් කර ගැනීමට කිසියම් පුද්ගලයකු යම්කිසි නිෂ්පාදිතයකට දක්වන විශේෂ කැමැත්ත / පුද්ගලයෙකු සිය අවශ්‍යතාවය තෘප්තිමත් කර ගන්නා ආකාරය

නිෂ්පාදිත - අවශ්‍යතා හා උවමනා තෘප්තිමත් කිරීමට ඉදිරිපත් කෙරෙන ඕනෑම දෙයකි.

*ලකුණු 1/2 x 3 ලකුණු 1 1/2 යි*

අවශ්‍යතා තෘප්තිමත් කර ගැනීමට පුද්ගලයින් පදනම් කර ගන්නා විවිධ ක්‍රම වුවමනා වන අතර ඒ සඳහා ඇති විසඳුම් නිෂ්පාදිත වේ.

අවශ්‍යතා (පදනම) ⟶ වුවමනා (ක්‍රමය) ⟶ නිෂ්පාදිතය (විසඳුම)

(ලකුණු 1/2 )

(ආ) නිෂ්පාදන ක්‍රමය සෘජු නිෂ්පාදනයේ සිට වක්‍ර නිෂ්පාදනය දක්වා මාරු වීමට බලපෑ ප්‍රධාන හේතු **හතරක්** දක්වන්න. (ලකුණු 04 යි)

1. පුද්ගල විශේෂීකරණය
2. අතිරික්ත නිෂ්පාදනය
3. භාණ්ඩ හුවමාරුව
4. වෙළෙඳාම

*ලකුණු 1/2 x 4 ලකුණු 02 යි*

(ii) (අ) නව පරපුර කෘෂිකර්මාන්තයේ නියුක්ත වීමට අකමැත්තක් දක්වනු ලැබේ. මෙසේ වීමට බලපා ඇති හේතු **හතරක්** දක්වන්න.

1. අස්වැන්නේ ආදායමේ ඇති අවිනිශ්චිතතාව
2. වෘත්තිමය වශයෙන් යහපත් ප්‍රතිරූපයක් ඇති නොවීම
3. සමාජ පිළිගැනීමක් ඇති නොවීම
4. ප්‍රාග්ධන ගැටළු පැන නැගීම
5. හොඳ වෙළෙඳපොලක් නොමැති වීම
6. කෘෂි කර්මාන්තය සඳහා අවශ්‍ය කුසලතා නොමැති වීම
7. අධ්‍යාපන ක්‍රමයෙන් කෘෂි කර්මාන්තය පිළිබඳව දැනුම ආකල්ප හා කුසලතා අවශ්‍ය පරිදි නොලැබීම
8. පුද්ගල ආකල්ප

*ලකුණු 1/2 x 4 ලකුණු 02 යි*

(ආ) සාර්ව පරිසරයේ දැකිය හැකි විශේෂ ලක්ෂණ **දෙකක්** ලියන්න. (ලකුණු 04 යි)

1. වේගයෙන් වෙනස් වන බව
2. ගතික බව
3. විවිධාකාරයේ බලපෑම් ඇතිකරන බව
4. සංකීර්ණ බව
5. තරඟකාරී බව
6. ගෝලීය බව
7. අන්තර් සම්බන්ධතාවක් පවතින බව
8. පාලනය කළ නොහැකි බව

*ලකුණු 1/2 x 4 ලකුණු 02 යි*

(iii) ගෝලීයකරණය යනු කුමක් දැ'යි අර්ථකථනය කර, එය දේශීය ව්‍යාපාර කෙරෙහි ඇති කරන ධනාත්මක හා සෘණාත්මක බලපෑම් **දෙක** බැගින් විස්තර කරන්න. (ලකුණු 04 යි)

ආර්ථික, දේශපාලනමය හා සංස්කෘතිමය වශයෙන් රටවල් අතර ඇති අන්තර් සම්බන්ධතාව/ පුද්ගලයන්, රාජ්‍යයන් හා සංවිධාන ජාත්‍යන්තර වශයෙන් ගොඩනගන සම්බන්ධතාව

*(ලකුණු 02)*

ධනාත්මක බලපෑම්

1. පුළුල් වෙළෙඳපොලක් නිර්මාණය වීම
2. නව තාක්ෂණය ගලා ඒම
3. නව දැනුම හුවමාරු වීම
4. ආර්ථික පිරිමැසුම් ලබා ගත හැකි වීම
5. යටිතල පහසුකම් සහ ව්‍යාපාරික සේවා දියුණු වීම

*ලකුණු 1/2 x 2 ලකුණු 01 යි*

සෘණාත්මක බලපෑම්

1. ගෝලීය තරඟයට මුහුණ දිය යුතු වීම/ දේශීය කර්මාන්ත අඩපණ වීම
2. බුද්ධි ගලනය නිසා පුහුණු ශ්‍රම හිඟය
3. අලෙවිකරණ පිරිවැය ඉහළ යාම
4. ජීවන රටාව හා සංස්කෘතික වටිනාකම් වෙනස් වීම නිසා සාම්ප්‍රදායික කර්මාන්ත අඩපණ වීම

*ලකුණු 1/2 x 2 ලකුණු 01 යි*

(iv) (අ) 'සංවිධාන සංස්කෘතිය' යන්න අර්ථකථනය කරන්න.

සංවිධානයක් තුළ පොදු හැසිරීම් රටාවක් ඇති කර ගැනීම සඳහා ස්ථාපිත කරගත් පොදුවේ පිළිගැනීමට ලක් වූ විශ්වාසය වටිනාකම් හා සාරධර්ම මාලාවකි.

*(මෙම අදහස ඇතුළත් පිළිතුරකට ලකුණු 02)*

ශක්තීන් හා උදාහරණ

1. පොදු ධනාත්මක චර්යා පද්ධතියක් පැවතීම

   උදා : ආයතනය තුළ පොදු හැසිරීම් රටාවක් ඇති වීම

2. විශ්වාසය පදනම් කරගත් සම්බන්ධතා ඇති වීම

   උදා : පක්ෂපාතී සේවකයන් ගැටුම් ඇති නොවීම

3. සහයෝගීතාව

   උදා : කණ්ඩායමක් ලෙස කටයුතු කිරීම

4. අනන්‍යතාවයට අන්අයට ගරු කිරීම -

   උදා : ඇගයීම හා එකිනෙකාට ගරු කිරීම

*ශක්තියකට ලකුණු 1/2*
*උදාහරණයකට ලකුණු 1/2*

(ආ) සංවිධාන සංස්කෘතිය තුළ ඇති ශක්තියක් හා දුර්වලතාවයක් එක් උදාහරණය බැගින් දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

දුර්වලතා

1. සංස්කෘතික බැඳියාව - වෙනස් වීමට ඇති අකමැත්ත/ කොටු වූ මානසිකත්වය

2. අසමානව සැලකීම - ධූරාවලි මානසිකත්වයක් පැවතීම සහ පක්ෂ ග්‍රාහීව සැලකීම

3. විශ්වාසය, වටිනාකම්, සාරධර්මවල අපැහැදිලි බව/ පිළිනොගැනීම උප සංස්කෘතීන් බිහි වීම හා සේවකයින් අතර ගැටුම් ඇති වීම

*දුර්වලතාවයකට ලකුණු 1/2*

*උදාහරණයකට ලකුණු 1/2*

(v) ව්‍යාපාර සමාජ වගකීම් යනු කුමක් දැ'යි පැහැදිලි කර, වර්තමාන සමාජය තුළ එය වැදගත්වීමට හේතු **තුනක්** ලියන්න. (ලකුණු 04 යි)

ආර්ථික, සමාජීය හා පරිසරය සමග ව්‍යාපාරයේ ඇති බැඳීමයි. / ව්‍යාපාරයක් සිය පාරිභෝගිකයන්ට පමණක් නොව සියළුම පාර්ශවයන්ට සාධාරණයක් වන අයුරින් කටයුතු කිරීමට ඇති බැඳීමයි.

*ඉහත අදහස ඇතුළත් අර්ථකථනයට ලකුණු 01*

*වැදගත් වීමට හේතු :*

1. පරිසර දූෂණය ඉහළ යාම නිසා පරිසරය ආරක්ෂා කිරීම අවශ්‍ය වීම
2. වංචා, දූෂණ අවම කිරීමට හා වැළැක්වීමට
3. දිළිඳුබව හා කුසගින්න අවම කර සමාජ සාධාරණත්වය ඇති කිරීම
4. සමාජය තුළ ආචාරධර්ම පිරිහීම නිසා ආචාර ධර්ම ප්‍රවර්ධනයට
5. ලෝකයේ සම්පත් හිඟවීම නිසා කාර්යක්ෂම ලෙස සම්පත් භාවිතයට

*ලකුණු 1 x 3 ලකුණු 03 යි*

2. (i) ආහාර ද්‍රව්‍ය නිෂ්පාදකයෙකු සිය නිෂ්පාදනවල ගුණාත්මය තහවුරු කිරීම සඳහා ආචාර ධර්ම පද්ධතියක් ගොඩනැගීමේදී, ඔහු විසින් සැලකිල්ලට ගත යුතු සාධක **හතරක්** සඳහන් කර, එම සාධක සැලකිල්ලට ගත යුත්තේ ඇයි දැ'යි පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

| | සාධක | හේතු |
|---|---|---|
| 1 | ප්‍රතිපෝෂකයන්-(ගනුදෙනුකරු) | ගැනුම් චර්යාව හා මිලදී ගැනීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු සම්බන්ධ ආචාර ධර්ම ගොඩ නැගීම |
| 2 | අමුද්‍රව්‍ය හා අනෙකුත් යෙදවුම් (සැපයුම්කරු) | අමුද්‍රව්‍යවල ගුණාත්මය තහවුරු කර ගැනීමට අවශ්‍ය ආචාර ධර්ම ගොඩ නැගීමට |
| 3 | නිෂ්පාදන ක්‍රියාවලිය (සේවකයින්) | සේවක චර්යාව හා සේවක විනය මෙන්ම සේවක දායකත්වය (ගුණාත්මය ඉහළ නැංවීමට අදාළව) සම්බන්ධ ආචාර ධර්ම ගොඩ නැගීමට |
| 4 | ලාභයට වඩා සමාජ වගකීම (අයිතිකරුවන්) | ගුණාත්මය හා ලාභය පිළිබඳ සමබරතාවය ගොඩ නැගීමට සම්බන්ධ ආචාර ධර්ම ගොඩ නැගීමට |
| 5 | ආචාර ධර්ම සුරැකීම (තරගකරුවන්) | තරගකාරීත්ව ප්‍රතිචාර හා උපාය මාර්ග සම්බන්ධ ආචාර ධර්ම ගොඩ නැගීමට |

*සාධක හතරට ලකුණු 1/2 x 4 ලකුණු 02 යි*

*විස්තර කිරීමට ලකුණු 1/2 x 4 ලකුණු 02 යි*

(ii) කෘෂි නිෂ්පාදන සඳහා පනවනු ලබන ආනයන බදු තුළින් බලපෑම් ඇති වන පාර්ශ්ව **හතරක්** නම් කර, එමගින් එක් එක් පාර්ශ්වයට ලැබෙන වාසි **එක** බැගින් ලියන්න. (ලකුණු 04 යි)

1. දේශීය කෘෂි නිෂ්පාදකයා
   - තම වෙළෙඳපොළ ආරක්ෂා වේ
   - ජාත්‍යන්තර තරගය අඩු වේ
   - ඉහළ මිළක් ලැබේ
2. දේශීය කෘෂි පාරිභෝගිකයා
   - නැවුම් භාණ්ඩ පාරිභෝජනයට අවස්ථාව ලැබීම
3. දේශීය කෘෂි නිෂ්පාදන බෙදා හරින්නන්/ ව්‍යාපාරිකයින්
   - විකුණුම් වැඩි වී ලාභය ඉහළ යාම

4. රජය

- බදු ආදායම ඉහළ යාම
- ආනයන අඩු වීම නිසා ගෙවුම් ශේෂ හිඟය අවම වීම
- විදේශ විනිමය ඉතිරි වීම
- දළ දේශීය නිෂ්පාදිතය ඉහළ යාම

5. සමාජය

- දේශීය කර්මාන්ත දියුණු වීම
  රැකියා අවස්ථා හා නව ආදායම් මාර්ග වර්ධනය

*පාර්ශව නම් කිරීමට 1/2 x 4 ලකුණු 02 යි*

*වාසි නම් දැක්වීමට 1/2 x 4 ලකුණු 02 යි*

(iii) ව්‍යාපාර සාර්ථකව කරගෙන යාමට රජයක් විසින් විවිධාකාරයෙන් මැදිහත්වීම් සිදු කරනු ලැබේ. එසේ මැදිහත්වීමේ ක්‍රම **හතරක්** දක්වා, එම එක් එක් ක්‍රමය තුළින් රජයක් අපේක්ෂා කරන්නේ කුමක් දැ'යි විස්තර කරන්න. (ලකුණු 04 යි)

| | ක්‍රම | අපේක්ෂාවන් |
|---|---|---|
| 1 | යටිතල පහසුකම් සැපයීම | ආයෝජන ප්‍රවර්ධන කිරීම |
| 2 | ඒකාධිකාරීත්වය පාලනය කිරීම | තරඟකාරී මිලට පාරිභෝගිකයාට වඩා හොඳ සේවාවක් ලබා දීම |
| 3 | ප්‍රතිපත්ති සම්පාදනය කිරීම | විධිමත්ව හා ක්‍රමවත්ව ව්‍යාපාර කටයුතු කරගෙන යාම |
| 4 | නීතිරීති පැනවීම | නාස්තිය හා දූෂණය අඩුකර අවශ්‍ය පහසුකම් තහවුරු කිරීමට |
| 5 | දිරිගැන්වීම් ලබා දීම | නව ව්‍යාපාර අද්දවා ගැනීම හා දැනට සිටින ව්‍යාපාර රඳවා ගැනීමට |
| 6 | බදු සහන ලබා දීම | ආයෝජන ධෛර්යමත් කිරීම |
| 7 | ගනුදෙනුකරුවකු වීම | නිෂ්පාදන කටයුතු අඛණ්ඩව පවත්වා ගෙන යාමට සහ තිරසාර සංවර්ධනයට සහය වීම |

ක්‍රම දැක්වීමට 1/2 x 4 ලකුණු 02 යි

අපේක්ෂාවන් දැක්වීමට 1/2 x 4 ලකුණු 02 යි

(iv) (අ) හවුල්කරුවන් අතර ආරවුල් හටගැනීමට බලපානු ලබන කරුණු **හතරක්** කෙටියෙන් පැහැදිලි කරන්න.

අ. පහත සඳහන් අවස්ථාවන්හි දී ඇතිවන ගැටළු

1. කළමනාකරණ තීරණ ගැනීමේ දී
2. ව්‍යාපාර කටයුතු සඳහා සහභාගී වීමේ දී
3. ලාභ/ අලාභ බෙදා ගැනීමේ දී
4. ණය ප්‍රාග්ධනය සඳහා පොළී ලබා ගැනීමේ දී
5. යෙදූ ප්‍රාග්ධනයට පොලී ලබා ගැනීමේ දී
6. හවුල් ව්‍යාපාරයේ දේපළ පරිහරණයේ දී
7. වරප්‍රසාද භුක්ති විඳීමේ දී
8. හවුල් ව්‍යාපාරයේ අයිතිය වෙනස් වීමේ දී

*ලකුණු 1/2 x 4 ලකුණු 02 යි*

(ආ) ජනතාවට අවශ්‍ය නිෂ්පාදිත රාජ්‍ය ආයතන තුළින් ලබා දීමට රජය විසින් කටයුතු කරනු ලැබේ. එවැනි රාජ්‍ය ආයතන වර්ග **හතරක්** නම් කරන්න. (ලකුණු 04 යි)

1. රාජ්‍ය සංස්ථා / අධිකාරි / මණ්ඩල / කොමිෂන් සභා
2. රාජ්‍ය දෙපාර්තමේන්තු
3. රාජ්‍ය සමාගම්
4. ප්‍රාදේශීය අධිකාරිය යටතේ පවතින ව්‍යාපාර

*ලකුණු 1/2 x 4 ලකුණු 02 යි*

(v) වරලත්හිමියාට මෙන් ම වරලත්ලාභියාට ද ඉටු කළ යුතු කාර්ය සමූහයක් පවතී. වරලත්ලාභියකු විසින් ඉටු කළ යුතු කාර්ය **හතරක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04 යි)
(මුළු ලකුණු 20 යි)

1. වරලත් හිමියා පනවනු ලබන කොන්දේසි අනුව කටයුතු කිරීම
2. ප්‍රාග්ධනය ආයෝජන කිරීම
3. වරලත් හිමියාගෙන් හෝ ඔහු විසින් නිර්දේශ කරන ලද සැපයුම්කරුවන්ගෙන් භාණ්ඩ මිලදී ගැනීම
4. වරලත් හිමියාට ගිවිසගත් පරිදි පුරස්කාරය ගෙවීම

*ලකුණු 1 x 4 ලකුණු 4 යි*

3. (i) රැකියාවක් කිරීමට වඩා තමාගේම ව්‍යාපාරයක් ආරම්භ කිරීමට ඔබගේ මිතුරෙකුට කැමැත්තක් පවතින නමුත් ඔහු තුළ ඒ සඳහා බියක් ද සවතී. රැකියාවක් කිරීමට වඩා ව්‍යාපාරයක් ආරම්භ කිරීමේ වාසි ඔහුට පැහැදිලි කිරීමට කරුණු **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

1. තම හැකියා හා දක්ෂතා වලින් ප්‍රයෝජන ගත හැකි වීම
2. ස්වාධීනව හා තම අභිමතය පරිදි කටයුතු කළ හැකි වීම
3. තම කැපවීම හා උනන්දුවමත ඉහළ ප්‍රතිලාභ ලබා ගත හැකි වීම
4. රැකියාවකින් යැපෙන්නකු නොව රැකියා ජනිත කරන්නෙකු විය හැකි වීම
5. සමාජ තත්වය හා ඉහළ පිළිගැනීමක් ඇති වීම
6. තමගේ ප්‍රධානියා තමාම වීම
7. ආත්ම තෘප්තියක් ලබා ගත හැකි වීම
8. රැකියාවකින් ලබන වැටුප නිශ්චිත වුවත් තම ව්‍යාපාරයකින් ලබන අදායම් සීමාවක් නොමැති වීම

*ලකුණු 1 x 4 ලකුණු 04 යි*

(ii) ව්‍යවසායකයින් විශාල වශයෙන් රටකට අවශ්‍ය වුවත් ඔවුන් බිහිවන්නේ සුළු වශයෙනි. එසේ සුළු වශයෙන් ව්‍යවසායකයින් බිහිවීමට බලපානු ලබන සාධක **හතරක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04 යි)

1. ව්‍යවසායකත්ව කුසලතා සංවර්ධනය සඳහා අධ්‍යාපන ක්‍රමයේ සහයෝගය අඩු වීම
2. ව්‍යවසායකත්ව වර්ධනයට අවශ්‍ය යටිතල පහසුකම් ප්‍රමාණවත් නොවීම
3. මූල්‍ය සහයෝගය අඩු වීම
4. නෛතික හා බදු ප්‍රතිපත්ති රාමුව ව්‍යවසායකයන් ඇති කරීමට යෝග්‍ය නොවීම
5. ව්‍යවසායකත්වය පිළිබඳව ඇති සංස්කෘතික වටිනාකම් හා සමාජ ආකල්ප යහපත් නොවීම
6. අවදානම් දැරීමට ඇති අකමැත්ත
7. නිර්මාණශීලීව හා නවෝත්පාදන හැකියාවකින් යුත් පුද්ගලයන් බිහිවීමේ අඩුකම/ ව්‍යවසායකත්ව පෞරුෂත්වයකින් යුත් පුද්ගලයන්ගේ අඩුකම
8. පර්යේෂණ හා සංවර්ධන සඳහා වැඩි අවධානයක් යොමු නොවීම

*ලකුණු 1 x 4 ලකුණු 04 යි*

(iii) බොහෝ රටවල මහා පරිමාණ ව්‍යාපාරවලට වඩා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සංඛ්‍යාව විශාල වේ. එම සංඛ්‍යාව ඉහළ යාමට බලපානු ලබන සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලට ආවේණික වූ ලක්ෂණ **හතරක්** ලියන්න. (ලකුණු 04 යි)

1. කුඩා ප්‍රාග්ධනයක් ආයෝජනයෙන් ආරම්භ කළ හැකි වීම
2. ඕනෑම ස්ථානයක ආරම්භ කළ හැකි වීම
3. මහා පරිමාණ ව්‍යාපාර අත නොගසන ව්‍යාපාර ක්ෂේත්‍රයන්ට යොමු වීම
4. දැඩි නෛතික කොන්දේසි බල නොපැවැත්වීම
5. ඕනෑම ව්‍යාපාර සංවිධාන ක්‍රමයක් යටතේ වුවද ආරම්භ කළ හැකි වීම
6. මහා පරිමාණ ව්‍යාපාරවලට අවශ්‍ය අනෙකුත් සේවා හා යෙදවුම් සැපයීම
7. විවිධ දිරිගැන්වීම් හා අනුග්‍රහයන් ලැබීම

*මීට අමතරව*

8. අඩු සේවක සංඛ්‍යාවකින් පවත්වාගෙන යා හැකිවීම නිසා සේවක පිරිවැය අඩු වීම
9. ව්‍යාපාරයේ කළමනාකරණය ස්වාධීන වීම

*ලකුණු 1 x 4 ලකුණු 04 යි*

(iv) මූල්‍ය සමාගම් ව්‍යාපාර සංවර්ධනය සඳහා විවිධ සේවා සපයයි. ව්‍යාපාරවලට මූල්‍ය සමාගම් මගින් සපයන සේවා **හතරක්** විස්තර කරන්න. (ලකුණු 04 යි)

1. කුලීපිට ගැනුම් පහසුකම් සැපයීම
2. කල්බදු මූල්‍යකරණය
3. ණය සැපයීම
4. කාලීන තැන්පතු භාර ගැනීම
5. මුදල් හුවමාරුව සඳහා පහසුකම් සැපයීම
6. කොටස් ප්‍රාරක්ෂණය

*ලකුණු 1 x 4 ලකුණු 04 යි*

(v) "විද්‍යුත් මුදල් භාවිතය තුළින් වාසි මෙන් ම අවාසි ද සිදු වේ." මෙම ප්‍රකාශය විද්‍යුත් මුදල් භාවිතයේ වාසි හා අවාසි **දෙක** බැගින් දක්වමින් තහවුරු කරන්න. (ලකුණු 04 යි)
(මුළු ලකුණු 20 යි)

වාසි

1. ගනුදෙනු කිරීමේ පිරිවැය අඩු වීම
2. මුදල් එහා මෙහා ගෙනයාමේ අවදානම ඉවත් වීම
3. දවසේ පැය 24 පුරාම ගනුදෙනු කළ හැකි වීම
4. ගෙවීම් කටයුතු පහසු වීම/ වේගවත් වීම
5. විවිධ ප්‍රතිලාභ හිමි වීම
6. විදේශ ගනුදෙනු සඳහා ද භාවිතා කළ හැකි වීම (ගෝලීය පිවිසුම)

*ලකුණු 1 x 2 ලකුණු 02 යි*

අවාසි

1. පොලී, ප්‍රමාද ගාස්තු වැනි පිරිවැය දැරීමට සිදු වීම
2. වංචනික ක්‍රියා සිදු විය හැකි වීම
3. අනවශ්‍ය පරිභෝජන රටාවකට හුරු වීම
4. තාක්ෂණික දෝෂ නිසා ගනුදෙනුවලට බාධා සිදු වීම
5. සියලුම ගනුදෙනුකරුවන්ට විද්‍යුත් මුදලින් ගනුදෙනු කිරීමට හැකියාවක් හා ශක්තියක් නොමැති වීම
6. විද්‍යුත් මුදලින් ගනුදෙනු කළ හැකි අවස්ථා සීමිත වීම
7. විද්‍යුත් මුදලින් ගනුදෙනු කිරීමේ සීමාවන් පැවතීම

*ලකුණු 1 x 2 ලකුණු 02 යි*

**4.** (i) (අ) රක්ෂණය කළ **නොහැකි** අවදානම් **හතරක්** සඳහා උදාහරණ සපයන්න.

(ආ) රක්ෂණ කර්මාන්තයේ සංවර්ධනයට දායක වීමට ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය පිහිටුවා ඇත. මෙම මණ්ඩලය මගින් ඉටු කරන කාර්ය **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(අ) 1. විභාග අසමත් වීම

2. ආදරය හා සෙනෙහස අහිමි වීම

3. යල් පැනීම, ක්ෂය වීම, මල බැඳීම වැනි ස්වාභාවික හේතු

4. වැරදි කළමනාකරණ තීරණ නිසා සිදුවන ව්‍යාපාර අලාභ

*ලකුණු 1 x 2 ලකුණු 02 යි*

(ආ) 1. රක්ෂණ සමාගම් ලියාපදිංචි කිරීම

2. රක්ෂණ බ්‍රෝකර්වරුන් ලියා පදිංචි කිරීම

3. රක්ෂණ සමාගම්වල ලියාපදිංචිය අත්හිටුවීම

4. රක්ෂණ අරමුදල් ආයෝජනය පිළිබඳ කඩඉම් නියම කිරීම

5. රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීම හා සංවර්ධනය කිරීම සඳහා රජයට උපදෙස් දීම

6. රක්ෂණ ව්‍යාපාරය සම්බන්ධයෙන් රජයේ ප්‍රතිපත්ති හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

7. රක්ෂණ ව්‍යාපාරයේ උන්නතිය සඳහා සෙස් බද්දක් පැනවීම

*ලකුණු 1/2 x 4 ලකුණු 02 යි*

(ii) (අ) නුවරඑළියේ සිට කොළඹට පළතුරු ප්‍රවාහනය කිරීම සඳහා ප්‍රවාහන සේවාවක් තෝරා ගැනීමේදී සලකා බැලිය යුතු ප්‍රධාන කරුණු **හතරක්** දක්වන්න.

(ආ) දුම්රිය මගින් භාණ්ඩ ප්‍රවාහනය වර්ධනය කරලීම සඳහා ඔබ විසින් කරන යෝජනා **හතරක්** හේතු සහිතව විස්තර කරන්න. (ලකුණු 04 යි)

(අ) 1. පළතුරුවල ස්වභාවය

2. වේගවත් බව

3. ධාරිතාව

4. සුරක්ෂිත බව

5. සුලබ බව

6. පිරිවැය

*ලකුණු 1/2 x 4 ලකුණු 02 යි*

(ආ)

1. භාණ්ඩ ප්‍රවාහනයට සුදුසු දුම්රිය මැදිරි නවීකරණය කිරීම
2. විශාල ප්‍රමාණයක් එකවර ප්‍රවාහනය කළ හැකි වනසේ දුම්රිය මැදිරි ප්‍රමාණය වැඩි කිරීම
3. ගමනාන්තය දක්වා ගමන් කළ හැකි වන සේ අනෙකුත් මාධ්‍යයන්හි සම්බන්ධතා ගොඩනැගීම
4. GPS තාක්ෂණය මගින් ප්‍රවාහනය කරනු ලබන භාණ්ඩ පිළිබඳව තොරතුරු ලබා ගත හැකිසේ පහසුකම් සැපයීම
5. විවිධ භාණ්ඩලවලට ගැළපෙන සේ පහසුකම් ඇති දුම්රිය මැදිරි යොදා ගැනීම

   උදා : ශීතාගාර පහසුකම් සහිත මැදිරි
6. ප්‍රධාන දුම්රිය ස්ථානවල සිට, ව්‍යාපාර ස්ථාන, බස් නැවතුම්පොළ ද ආදී ස්ථාන සම්බන්ධ කරන විද්‍යුත් දුම්රිය ජාලයක් ස්ථාපිත කිරීම
7. භාණ්ඩ පැටවීමේ දී හා බෑමේ දී සුරක්ෂිතව සිදු කළ හැකි නවීන තාක්ෂණික උපකරණ හඳුන්වා දීම

*ලකුණු 1/2 x 4 ලකුණු 02 යි*

(iii) (අ) කළමනාකරණ සහකරුවන් සඳහා පැවැත්වූ පුහුණු සැසියකදී ලිපි ගොනු පවත්වා ගැනීම පිළිබඳ ඔබගේ දේශනයට සහභාගිවූවන්ගේ ප්‍රතිචාරය හොඳ මට්ටමක නොමැති බව කළමනාකාරිත්වය විසින් දන්වා ඇත. එවැනි ප්‍රතිචාරයක් ලැබීමට ඔබගේ දේශනයේදී සිදු විය හැකි දුර්වලතා **හතරක්** සඳහන් කරන්න.

(ආ) බොහෝ ආයතන සන්නිවේදන කටයුතු සඳහා විද්‍යුත් තැපැල භාවිත කරනු ලැබේ. විද්‍යුත් තැපැල භාවිත කිරීමේ වාසි හා අවාසි **දෙක** බැගින් සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(අ)

1. පැහැදිලිව හා නිරවුල්ව මෙන්ම සරලව කරුණු ඉදිරිපත් නොකිරීම
2. අදාළ උදාහරණ භාවිත නොකිරීම
3. අනවශ්‍ය විස්තර කිරීම්
4. හඬ පාලනය හා නිවැරදි උච්චාරණය නොමැති වීම
5. හැඟීම් හා ඉඟි පැහැදිලි නොවීම
6. ප්‍රේක්ෂකයින් හා දේශකයා අතර සම්බන්ධතාවයක් නොමැති වීම
7. ප්‍රේක්ෂක අවධානය ලබා ගත නොහැකි වීම
8. ප්‍රතිපෝෂණය ලබා නොගැනීම

*ලකුණු 1/2 x 4 ලකුණු 02 යි*

(ආ) *වාසි*

1. පිරිවැය අඩු වීම
2. වේගවත් වීම
3. විශ්වාසදායී වීම

4. පණිවුඩ යැවූ බව තහවුරු කර ගත හැකි වීම
5. ඕනෑම ස්ථානයක සිට පණිවුඩ හුවමාරු කළ හැකි වීම
6. එකම අවස්ථාවක දී පාර්ශව කීපයකට පණිවුඩ හුවමාරු කළ හැකි වීම
7. තොරතුරු ගබඩා කරගත හැකි වීම
8. ශබ්ද හා රූප යැවීමට හැකි වීම
9. ඉක්මණින් ප්‍රතිචාර ලබාගත හැකි වීම
10. ලිපිද්‍රව්‍ය භාවිතයක් නොමැති වීම
11. විශාල තොරතුරු ප්‍රමාණයක් එකවර හුවමාරු කරගත හැකි වීම

*ලකුණු 1/2 x 2 ලකුණු 01 යි*

*අවාසි*

1. තාක්ෂණික බාධා ඇතිවිය හැකි වීම
2. පණිවුඩය නිවැරදිව තේරුම් නොගැනීම
3. අන්තර්ජාල පහසුකම් ව්‍යාප්තිය අඩුවීම
4. පරිගණක සාක්ෂරතාවය අඩු වීම
5. සජීවී නොවීම
6. වෛරස් බලපෑම් ඇතිවිය හැකි වීම

*ලකුණු 1/2 x 2 ලකුණු 01 යි*

(iv) (අ) සාම්ප්‍රදායික සිල්ලර වෙළෙඳසැල් සඳහා සුපිරි වෙළෙඳසැල්වලින් දැඩි තර්ජනයක් පවතී. සුපිරි වෙළෙඳසැල් වෙත පාරිභෝගිකයින් වැඩි වශයෙන් ආකර්ෂණය වීමට හේතු **හතරක්** විස්තර කරන්න.

(ආ) ඇතැම් ශ්‍රී ලාංකික ව්‍යාපාරිකයින්ට ජාත්‍යන්තර වෙළෙඳපොළ තුළ ඇති තරගකාරිත්වයට මුහුණදීමට නොහැකි ය. එසේ නොහැකි වීමට හේතු වන ව්‍යාපාරිකයකුට පාලනය කළ හැකි සහ පාලනය කළ නොහැකි සාධක **දෙක** බැගින් ලියන්න. (ලකුණු 04 යි)

(අ)
1. ආකර්ශණීය බව, පිරිසිදු බව යන ගුණාංගවලින් යුක්ත වීම
2. රථ වාහන නතර කිරීමේ ස්ථාන වෙන් කර තිබීම
3. භාණ්ඩ තෝරා ගැනීමේ පහසුකම් පැවතීම
4. බැංකු ශාඛා, ස්වයංක්‍රීය බැංකු සේවා වැනි පහසුකම් පැවතීම
5. විද්‍යුත් මුදල් මගින් ගනුදෙනු කළ හැකි වීම
6. වායු සමනය කර තිබීම
7. අමතර පහසුකම් සලසා තිබීම
8. විවිධ භාණ්ඩ වර්ග එක් ස්ථානයකින් ලබා ගැනීමට හැකි වීම

*ලකුණු 1/2 x 4 ලකුණු 02 යි*

(ආ) පාලනය කළ හැකි

1. ජාත්‍යන්තර වෙළෙඳපොලට ගැළපෙන සේ ගුණාත්මකය පවත්වා ගැනීමට කටයුතු නොකිරීම

2. ජාත්‍යන්තර වෙළෙඳපොළට ගැළපෙන සේ භාණ්ඩ සැලසුම් කිරීම, මෝස්තරකරණය හා සංවර්ධනය සිදු නොකිරීම

3. යෝග්‍ය ප්‍රචාරණ හා ප්‍රවර්ධන ක්‍රම යොදා නොගැනීම

4. අයෝග්‍ය මිල ප්‍රතිපත්ති භාවිතය

5. ගනුදෙණුකාර සේවා ප්‍රමාණවත් නොවීම

6. අවශ්‍ය කුසලතා සහිත සේවකයන් නොමැති වීම

*ලකුණු 1 x 2 ලකුණු 02 යි*

පාලනය කළ නොහැකි

1. යටිතල පහසුකම් ප්‍රමාණවත් නොවීම

2. සහායක කර්මාන්ත දියුණු වීම

3. රජයේ ප්‍රතිපත්ති

4. රජයේ දුර්වල ජාත්‍යයන්තර සම්බන්ධතා

5. රාජ්‍ය අනුග්‍රහය දුර්වල වීම

6. සේවක වැටුප් හා වෙනත් පිරිවැය ඉහළ යාම

7. ජාත්‍යන්තර වෙළෙඳාමට සහාය වන ආයතන හා පද්ධතිවල ආකාර්යක්ෂමතාවය හා දැඩි නීතිරීති

*ලකුණු 1/2 x 4 ලකුණු 02 යි*

(v) (අ) 'ගනුදෙනු කළ නොහැක' යන රේඛනය යෙදීමෙන් අණකරුට විශේෂිත වූ වාසියක් හිමි නොවේ. මෙම අදහසට ඔබ එකඟ වන්නේ ද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

(ආ) විද්‍යුත් වෙළෙඳාම (e-trade) ප්‍රචලිත වීමට බලපා ඇති කරුණු **හතරක්** දක්වන්න. (ලකුණු 04 යි)

(අ) එකඟ නොවේ

(ලකුණු 1 /2 )

"ගනුදෙනු කළ නොහැක" යන රේඛනයෙන් චෙක්පත ගනුදෙනු කළ නොහැකි ලියවිල්ලක් බවට පත්වන නිසා එවැනි චෙක්පතක් ලබා ගන්නෙකු අයිතියේ ඉතිහාසය පරීක්‍ෂා කළ යුතු යැයි ඇඟවීමක් මින් කරයි. එම නිසා මෙවැනි චෙක්පතක් නිරායාසයෙන් එකිනෙකා අතර පැවරීම සීමා වන හෙයින් ආදායකයාම මුදල් අය ලබා ගැනීම තහවුරු වේ. එසේම චෙක්පත පැවරීමේ ඉතිහාසයේ වංචාවක් සිදු වී ඇත්නම් එහිදී අණකරුගේ වගකීමක් ද නැත. එමනිසා මෙම ප්‍රකාශයට එකඟ විය නොහැක.

<u>අණකරු ආදායකයාට මුදල් ගෙවූ බවට මෙම රේඛනය මගින් සහතික කෙරේ. මෙමගින් චෙක්පත සාරකම් කිරීම හා වංචා කිරීම් අණකරුගේ වගකීමෙන් නිදහස් වේ.</u>

*(ඉරි ඇඳි පද ඇතිනම් ලකුණු 1 1/2යි)*

(ආ)

- දවසේ ඕනෑම වේලාවක ව්‍යාපාර කටයුතු කළ හැකි වීම
- ආරම්භක පිරිවැය අඩු වීම
- ගනුදෙනු වේගවත් වීම
- වෙළඳපොළ පුළුල් වීම
- මිල මට්ටම සාපේක්ෂව අඩු වීම/ අතරමැදියන් නොමැති වීම
- භාණ්ඩ තෝරා ගැනීමට පුළුල් ඉඩකඩක් පැවතීම
- ගණුදෙනුවලට අදාළ ක්‍රියාකාරී පිරිවැය අවම වීම
- තම භාණ්ඩ පරිහරණයට අවස්ථාව ලැබීම
- ලියකියවිලි භාවිතය අඩු වීම
- ගනුදෙනු සම්පූර්ණයෙන් විනිවිද භාවයෙන් යුක්ත වීම
- තොග පවත්වාගෙන යාමට අවශ්‍ය නොවීම
- වැඩි ඉඩ ප්‍රමාණයක් අවශ්‍ය නොවීම

*ලකුණු 1/2 x 4 ලකුණු 02 යි*

## II කොටස

5. (i) (අ) "අන් අය ලවා වැඩ කරවා ගැනීමේ කලාව කළමනාකරණය වේ." මෙම නිර්වචනය පැහැදිලි කරන්න.

(ආ) පසුගිය සතියේ ඔබේ පාසලේ පැවති වාණිජ දිනය සංවිධානය කිරීමේ කණ්ඩායමෙහි ඔබ ද සාමාජිකයකු විය. එම දිනය පැවැත්වීම සඳහා ඔබ කණ්ඩායම විසින් ඉටු කරන ලද කාර්ය **හතරක්** උදාහරණ ලෙස යොදා ගනිමින් කළමනාකරණ ශ්‍රිත විස්තර කරන්න. (ලකුණු 04 යි)

(අ) කළමනාකරුවෙකු කාර්යයන් ඉටුකරන්නෙකු නොව කාර්යයන් ඉටුකරවා ගන්නෙකි. ඒ සඳහා නිශ්චිත රටාවක් නොමැත. අවස්ථාව අනුව එම කාර්යයන් ඉටු කරවා ගැනීමට කළමනාකරුවෙකු සමත් විය යුතු ය. ඒ සඳහා විවිධ රටා හා ක්‍රම ඔහුට අනුගමනය කළ හැකිය. ආයතනයේ අරමුණු හා පරමාර්ථ සඵලදායීව ඉටු කර ගත හැක්කේ කළමනාකරුවෙකුගේ ශෛලිය අනුවය.

*(ඉරි ඇඳි පද සහිත සම්පූර්ණ පිළිතුරකට ලකුණු 02)*

ආ. සැලසුම්කරණය

- වාණිජ දිනයේ තේමාව අරමුණ ස්ථාපිත කිරීම
- වාණිජ දිනය තීරණය කිරීම
- අමුත්තන් හා ආරාධිත පාසැල් තීරණය කිරීම
- අනුග්‍රහකයන් හා අරමුදල් පිළිබඳ තීරණ
- පාසල් අනුමැතිය හා අවශ්‍ය ශාලා වෙන් කරගැනීමේ අනුමැතිය

*එක් කරුණකට ලකුණු 1/2 යි*

සංවිධානකරණය

- වාණිජ දිනට පෙර කාර්යයන් හඳුනා ගැනීම
- වාණිජ දින කාර්යයන් වෙන් කර හඳුනා ගැනීම
- ඒ ඒ කණ්ඩායම්වලට වැඩ බෙදීම
- මුදල් කමිටුව, සංග්‍රහ කමිටුව, සන්නිවේදනය කමිටුව ආදි වශයෙන් වෙන් කිරීම
- ඒ ඒ කමිටුවට බලතල වගකීම් පවරා දීම
- සම්පත් වෙන්කර දීම

*එක් කරුණකට ලකුණු 1/2 යි*

මෙහෙයවීම

- මුදල් සංග්‍රහ සන්නිවේදන ආදී කමිටුවල වගකීම් දරන්නන්ගේ අවශ්‍යතා විමසීම
- ඒ ඒ කමිටු අතර පොදු කරුණු පිළිබඳ දැනුවත් කිරීම
- ඒ ඒ කමිටුවල කටයුතු කරන සිසුන් උද්යෝගිමත් කිරීම හා වාණිජ දිනයේ කටයුතු කිරීමට යොමු කිරීම

*එක් කරුණකට ලකුණු 1/2 යි*

පාලනය

- න්‍යාය පත්‍රයේ සඳහන් අයිතම ඒ ඒ වෙලාවට සිදුවීම සහතික කිරීම
- අමුත්තන් පිළිගැනීම, සංග්‍රහ කිරීම සහ අනෙකුත් ක්‍රියාත්මක කිරීම පිළිබඳව ප්‍රතිපෝෂණයක් ලබා ගැනීම

*එක් කරුණකට ලකුණු 1/2 යි*

(ii) (අ) කළමනාකරුවකුගේ සංකල්පනාත්මක කුසලතා යන්නට ඇතුළත් වන හැකියා **හතරක්** සඳහන් කරන්න.

(ආ) හෙන්රි මින්ස්බර්ග්ගේ කළමනාකරණ භූමිකාවල **නායකයා** සහ **ව්‍යවසායකයා** යන උප භූමිකාවලට අයත් කාර්ය විස්තර කරන්න. (ලකුණු 04 යි)

(අ)

1. අභ්‍යන්තර හා බාහිර පරිසර බලපෑම් හඳුනාගැනීමේ හැකියාව
2. සමස්තය විශ්ලේෂණය කිරීමේ හැකියාව
3. ගැටලු තේරුම් ගැනීමේ හා විසඳීමේ හැකියාව
4. දූරදර්ශීභාවය
5. තීක්ෂණව සිතීමේ හැකියාව
6. තීරණ ගැනීමේ හැකියාව

*ලකුණු 1/2 x 4 ලකුණු 02 යි*

ආ. නායකයා

1. සේවක කටයුතු අගය කිරීම
2. ගුණදොස් දැක්වීම
3. සේවකයින් උසස් කිරීම හා ඉවත් කිරීම

*ලකුණු 1/2 x 2 ලකුණු 01 යි*

ව්‍යවසායකයා

1. නව ව්‍යාපෘති හඳුන්වා දීම
2. ක්‍රියාවලි හඳුන්වා දීම
3. සංවිධාන ව්‍යුහය වෙනස් කිරීම

*ලකුණු 1/2 x 2 ලකුණු 01 යි*

(iii) ව්‍යාපාර උපදේශන සමාගමක් විසින් ඔබට නිෂ්පාදන පිරිවැය අවම කර ගැනීම සඳහා නව සූර්ය බලශක්ති පද්ධතියක් හා නිෂ්පාදනාගාර ස්වයංක්‍රියකරණය කිරීමේ පද්ධතියක් යෝජනා කර ඇත. මෙම විකල්පවලින් එකක් තෝරා ගැනීමට ඔබ අදහස් කරන අතර ඒ සඳහා මෙම විකල්ප ඇගයීමට යොදාගත හැකි නිර්ණායක **හතරක්** විස්තර කරන්න. (ලකුණු 04 යි)

1. පිරිවැය - ක්‍රම 2 ට අදාළ පිරිවැය සැසඳීම
2. භාවිත කිරීමේ හැකියාව - අදාළ කාර්යයට යොදා ගත හැකිද? යන්න
3. භාවිත කිරීමේ යෝග්‍යතාව - අදාළ කාර්යයට සුදුසුද? යන්න
4. සාපේක්ෂ වැදගත්කම - ආයතනයට සඵලදායී වන විකල්ප කුමක්ද?
5. පරිසර හිතකාමී බව - පරිසරයට සිදු කරන බලපෑම
6. කල් පැවැත්ම - කොතරම් කාලයක් පාවිච්චි කළ හැකිද? යන්න
7. තාක්ෂණික ශක්‍යතාව - අමතර කොටස් පිළිබඳව. අලුත්වැඩියාව හා ක්‍රියාකරවන්නන් පිළිබඳ
8. පිළිගැනීම - ආයතනයේ පිළිබඳව අනෙකුත් පාර්ශවයන්ගේ කැමැත්ත
9. පැවැත්ම - තාක්ෂණය යල් පැනීමට ඇති ඉඩකඩ

*නම් කිරීමට ලකුණු 1/2 x 4 ලකුණු 02 යි*
*නම් කිරීමට ලකුණු 1/2 x 4 ලකුණු 02 යි*

(iv) සංවිධානකරණයේ පියවර නම් කර, ඉන් පියවර **තුනක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04 යි)

1. කාර්ය හඳුනා ගැනීම
2. වැඩ බෙදීම
3. දෙපාර්තමේන්තුකරණය
4. අධිකාරිය හා වගකීම් පැවරීම
5. වැඩ කිරීමේ ප්‍රමිති ඇති කිරීම
6. සම්පත් බෙදා දීම
7. සමායෝජනය

*පියවර 4 ක් නම් කිරීමට ලකුණු 1/2*
*පියවර 7 ම නම් කිරීමට ලකුණු 1/2*
*විස්තර කිරීමට ලකුණු 1 x 3 ලකුණු 03 යි*

(v) (අ) පිරියත සැලැස්මක් අවශ්‍ය වන්නේ ඇයි දැ'යි පැහැදිලි කරන්න.
(ආ) වෙළෙඳ ආයතනයක මූල්‍ය විග්‍රහයේදී අනාවරණය වූයේ ආයතනය අනවශ්‍ය ලෙස තොග පවත්වා ගැනීම නිසා පාඩු සිදුවී ඇති බවයි. එවැනි පාඩු අවම කර ගැනීම සඳහා තොග පාලනයේදී අනුගමනය කළ හැකි උපක්‍රම **හතරක්** විස්තර කරන්න. (ලකුණු 04 යි)
(මුළු ලකුණු 20 යි)

ළ

1.

2. ඉඩකඩවලින් උපරිම ප්‍රයෝජන ගැනීමට හැකිවීම

3. ද්‍රව්‍ය භාවිත කිරීමේ පිරිවැය අඩුකරගත හැකි වීම

4. ද්‍රව්‍ය හා සේවකයින් චලනය වීමේ දී ඇතිවිය හැකි බාධා අවම වීම

5. අනතුරු අවම වීම

6. සමායෝජනය හා සුපරීක්ෂණය පහසු වීම

7. සේවකයින්ගේ චිත්ත ධෛර්ය ඉහළ යාම

*කරුණු 4 ට ලකුණු 1/2බැගින් ලකුණු 02 යි*

ආ.

1. තොග මට්ටම් නිශ්චය කිරීමේ ක්‍රමය

2. ABC විශ්ලේෂණය

3. ද්විත්ව භාජන ක්‍රමය

4. පරිගණක වැඩසටහන් ක්‍රමය

5. අඛණ්ඩ තොග වාර්තා කිරීමේ ක්‍රමය

6. JIT ක්‍රමය

*කරුණු 4 ට ලකුණු 1/2බැගින් ලකුණු 02 යි*

6. (i) (අ) ව්‍යාපාරයකට ඵලදායීතාවය වැදගත් වන්නේ ඇයි දැ'යි යන්න දැක්වීමට හේතු **හතරක්** සඳහන් කරන්න.
(ආ) ව්‍යාපාරයක ඵලදායීතාවය වැඩි කිරීමට යොදා ගනු ලබන පරිගණක ශිල්පීය ක්‍රමයක් වන 'පරිගණක ආධාරක නිර්මාණකරණය' (CAD) යනුවෙන් අදහස් කරන්නේ කුමක් දැ'යි දක්වා එහි ප්‍රතිලාභ **දෙකක්** ලියන්න. (ලකුණු 04 යි)

(අ) 1. ව්‍යාපාරයේ සම්පත් බෙදා හැරීම පිළිබඳ තීරණ ගැනීමට

2. ව්‍යාපාරය පුළුල් කිරීම පිළිබඳ තීරණ ගැනීමට

3. සෙසු සමාන ආයතන සමග ඵලදායීතාව සංසන්දනය කිරීමට

4. ව්‍යාපාර ආයතනයේ ප්‍රගතිය අවබෝධ කර ගැනීමට

*ලකුණු 1/2 x 4 ලකුණු 02 යි*

(ආ) පරිගණක මෘදුකාංග භාවිතා කොට ගෙන භාණ්ඩ නිර්මාණය කිරීමයි

*ලකුණු 01 යි*

*වාසි*

1. අපතේ යාම අවම කිරීම
2. භාණ්ඩ නිපදවීමේදී ත්‍රිමාණ හා ද්විමාන ආකෘති මගින් සංවර්ධනය කළ හැකි වීම
3. ලෝකයේ විවිධ ස්ථානවල නිර්මාණය කරන භාණ්ඩ ඒ ඒ ස්ථානවල සිටම හෝ වෙනත් ස්ථානවල සිට වැඩි දියුණු කළ හැකි වීම
4. භාණ්ඩ නිර්මාණය හා සංවර්ධනය කිරීමේ පිරිවැය අඩු වීම
5. අවසාන නිෂ්පාදිතය නිපදවීමට පෙර අවශ්‍ය දියුණු කිරීම් කළ හැකි වීම
6. ඵලදායීතාව වැඩිකර ගත හැකි වීම
7. ගුණාත්වය වැඩිකර ගත හැකි වීම
8. සන්නිවේදනය වර්ධනය වීම
9. නිෂ්පාදනයට අවශ්‍ය දත්ත පදනමක් ගොඩ නගා ගත හැකි වීම

*ලකුණු 1/2 x 2 ලකුණු 01 යි*

(ii) ඉන්ද්‍රපාල තම ප්‍රදේශයේ පැවැත්වූ අලුත් අවුරුදු පොළෙහි වෙළෙඳ කුටියක් කුලියට ගත් අතර, ඔහුගේ භාණ්ඩ සියල්ල ඒ හා සමාන භාණ්ඩ විකුණු අනෙක් වෙළෙඳ කුටිවලට වඩා ඉක්මනින් අලෙවි විය. ඉන්ද්‍රපාලගේ වෙළෙඳ කුටියේ භාණ්ඩ සියල්ල ඉක්මනින් අලෙවි වීමට හේතු විය හැකි කරුණු **හතරක්** විස්තර කරන්න.
(ලකුණු 04 යි)

1. මිල සාපේක්ෂව අඩුවිය හැකි බව - අනෙකුත් භාණ්ඩ හා සසඳන විට මිල අඩු වීම
2. පෞද්ගලික අලෙවි නිපුණතා - ඔහුගේ පෞද්ගලික ආකර්ෂණීය ගුණාංග
3. ආකර්ශණීය ඉදිරිපත් කිරීම - භාණ්ඩය පෙළ ගස්වා ඇති ආකාරය ආකර්ෂණීය වීම
4. ප්‍රද්රශන කුටිය පිහිටි ස්ථානය - පාරිභෝගිකයන්ට වඩා පහසු ස්ථානයක පිහිටීම
5. ඔහු භාවිතා කරනු ලැබූ ප්‍රවර්ධන ක්‍රමය - අනෙකුත් විකුණුම් කරුවන්ගේ ප්‍රවර්ධන ක්‍රමවලට වඩා ගැනුම්කරුවන් ආකර්ෂණය කරගත හැකි ක්‍රමයක් වීම

*නම් කිරීමට ලකුණු 1/2 x 4 බැගින් ලකුණු 02 යි*
*විස්තර කිරීමට ලකුණු 1/2 x 4 බැගින් ලකුණු 02 යි*

(iii) (අ) නිෂ්පාදකයකු තම භාණ්ඩවලට ඇසුරුමක් යෙදීමට මැලිකමක් දක්වයි. ඇසුරුමකින් යුක්තව තම භාණ්ඩ වෙළෙඳපොළට ඉදිරිපත් කිරීම සඳහා නිෂ්පාදකයා උනන්දු කිරීම සඳහා යොදා ගත හැකි කරුණු **හතරක්** සඳහන් කරන්න.

(ආ) භාණ්ඩ හා සේවා මිල කිරීමේ අරමුණු **හතරක්** ලියන්න. (ලකුණු 04 යි)

අ. 1. ඇසුරුම් සහිත භාණ්ඩ සඳහා පාරිභෝගික ආකර්ෂණය ඉහළ වීම

2. ව්‍යාපාරයේ හා සන්නාමෙහි ප්‍රතිරූපය ඉහළ යාම

3. භාණ්ඩයට ආරක්ෂාවක් ලැබීම

4. භාණ්ඩය පිළිබඳ තොරතුරු සැපයිය හැකි වීම

5. ප්‍රවර්ධනය පහසු වීම

6. භාණ්ඩ ප්‍රදර්ශනයට පහසු වීම

7. භාණ්ඩ ගබඩාකරණයට හා ප්‍රවාහනයට පහසු වීම

8. ස්වයං සේවා ක්‍රමයට අලෙවිය පහසු වීම

*ලකුණු 1/2 x 4 බැගින් ලකුණු 02 යි*

ආ.

1. වෙළෙඳපොළ තුළ රැඳී සිටීම
2. වර්තමාන ලාභ උපරිම කිරීම
3. වෙළෙඳපොළ කොටස උපරිම කිරීම
4. වෙළෙඳපොළ සාරය උරා ගැනීම
5. නිෂ්පාදිත ගුණාත්ව නායකත්වය ලැබීම

*ලකුණු 1/2 x 4 බැගින් ලකුණු 02 යි*

(iv) සංවිධානකරණයේ පියවර නම් කර, ඉන් පියවර **තුනක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04 යි)

1. දැනුම් දීම - නිෂ්පාදිතය පිළිබඳ පාරිභෝගිකයා දැනුවත් කිරීම
2. පෙළඹවීම - මිළදී ගැනීමට උනන්දුවක් ඇති කිරීම
3. දිරි ගැන්වීම - යෝග්‍යතාව තහවුරු කිරීම
4. සිහි ගැන්වීම - පාරිභෝගිකයාගේ මතකයෙහි රඳවා තැබීම

*නම් කිරීමට ලකුණු 1/2 x 4 බැගින් ලකුණු 02 යි*

*පැහැදිලි කිරීමට ලකුණු 1/2 x 4 බැගින් ලකුණු 02 යි*

(ලකුණු 04 යි)

(v) (අ) පිරියත සැලැස්මක් අවශ්‍ය වන්නේ ඇයි දැ'යි පැහැදිලි කරන්න.

(ආ) වෙළෙඳ ආයතනයක මූල්‍ය විග්‍රහයේදී අනාවරණය වූයේ ආයතනය අනවශ්‍ය ලෙස තොග පවත්වා ගැනීම නිසා පාඩු සිදුවී ඇති බවයි. එවැනි පාඩු අවම කර ගැනීම සඳහා තොග පාලනයේදී අනුගමනය කළ හැකි උපක්‍රම **හතරක්** විස්තර කරන්න. (ලකුණු 04 යි)

(මුළු ලකුණු 20 යි)

අ. 1. ඉතිරිකිරීම්

2. බැංකු ණය

3. වත්කම් විකිණීම

4. පෞද්ගලික ණය

5. හවුල්කරුවෙකු බඳවා ගැනීම

6. කල්බදු

7. කුලිපිට ගැනුම්

*ලකුණු 1/2 x 4 බැගින් ලකුණු 02 යි*

ආ.

1. ණයගැතියන්ගේ වටිනාකම වැඩි වීම

2. අතැති මුදල් ප්‍රමාණය වැඩි වීම

3. බැංකු ශේෂය ඉහළ වීම

4. ලැබිය යුතු ආදායම වැඩි වටිනාකමකින් යුක්ත වීම *ලකුණු 1/2 x 4 බැගින් ලකුණු 02 යි*

(මුළු ලකුණු 20 යි)

7. (i) (අ) ව්‍යාපාරයකට කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සපයා ගත හැකි මාර්ග **හතරක්** සඳහන් කරන්න.

(ආ) කොළඹ කොටස් හුවමාරුව තුළින් ලැයිස්තුගත සමාගමකට ලැබිය හැකි වාසි **හතරක්** විස්තර කරන්න. (ලකුණු 04 යි)

(අ) 1. බැංකු අයිරා

2. වාණිජ පත්‍රිකා

3. ගෙවිය යුතු වියදම් පමා කිරීම

4. කෙටි කාලීන බැංකු ණය

5. වෙළෙඳ ණය

6. බදු වෙන් කිරීම්

7. ලාභාංශ වෙන් කිරීම

*ලකුණු 1/2 x 4 බැගින් ලකුණු 02 යි*

(ආ) 1. සමාගම්වල කීර්තිනාමය හා ප්‍රතිරූපය ඉහළ වීම

2. සමාගම් කොටස්වලට වටිනාකමක් නිර්මාණය වීම

3. සමාගම් කොටස් සඳහා ද්විතියික වෙළෙඳ පොළක් හිමි වීම

4. උපාය මාර්ගික අයෝජකයන් ආකර්ශනය කරගත හැකි වීම

5. ප්‍රශස්ත ප්‍රාග්ධන ව්‍යුහයක් ඇති කර ගත හැකි වීම

6. සමාගමේ විශ්වාසනීය බව ඉහළ යාම

*ලකුණු 1/2 x 4 බැගින් ලකුණු 02 යි*

(ලකුණු 04 යි)

(ii) මානව සම්පත් කළමනාකරුවෙකු වශයෙන් ඔබ සේවය කරන ආයතනයට අලෙවි සහකරුවන් බඳවා ගැනීම සඳහා පිළිගෙල කරන අයදුම්පත්‍රයක ඇතුළත් විය යුතු තොරතුරු වර්ග **හතරක්** විස්තර කරන්න.

(ලකුණු 04 යි)

1. පුද්ගලික තොරතුරු - නම, උපන්දිනය, වයස, ලිපිනය වැනි

2. අධ්‍යාපන සුදුසුකම් - විභාග සමත් වීම ආදිය

3. වෘත්තිය සුදුසුකම් - රැකියාවට අදාළ වෙනත් සුදුසුකම්

4. රැකියා ඉතිහාසය - රැකියාවට අදාළ කාර්යයන් කළ කාලය පිළිබඳ (පළපුරුද්ද)

5. තොරතුරු ලබා ගත හැකි පුද්ගලයින් පිළිබඳ විස්තර - ඥාති සම්බන්ධතාවක් නොමැති පුද්ගලයන්ගේ නම, තනතුර, ලිපිනය, දුරකථන අංකය, ආදිය

*නම් කිරීමට ලකුණු 1/2 x 4 බැගින් ලකුණු 02 යි*

*පැහැදිලි කිරීමට ලකුණු 1/2 x 4 බැගින් ලකුණු 02 යි*

(ලකුණු 04 යි)

(iii) (අ) රැකියාවකට අයදුම්කරුවකු තෝරා ගැනීම සඳහා සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමට අමතරව විවිධ පරීක්ෂණ පවත්වනු ලබයි. එසේ පවත්වනු ලබන පරීක්ෂණ ක්‍රම **දෙකක්** විස්තර කරන්න.

(ආ) පත්වීම් ලිපියක අඩංගු තොරතුරු වර්ග කළ හැකි ආකාර **හතරක්** ලියන්න. (ලකුණු 04 යි)

අ. 1. සේවානියුක්ත විභාග

2. වෛද්‍ය පරීක්ෂණ

3. පසුබිම් පරීක්ෂණ

4. ප්‍රායෝගික පරීක්ෂණ

*නම් කිරීමට ලකුණු 1/2 x 2 බැගින් ලකුණු 01 යි*

*විස්තර කිරීමට ලකුණු 1/2 x 2 බැගින් ලකුණු 01 යි*

ආ. 1. රැකියාව පිළිබඳ කොන්දේසි

2. රැකියාව පිළිබඳ නියමයන්

3. කාර්යයන්

4. යුතුකම් හා වගකීම්

*ලකුණු 1/2 x 4 - ලකුණු 02 යි*

(iv) පාඩු ලබන ආයතනයක් තම සේවක සංඛ්‍යාව අඩු කිරීමට අදහස් කරයි. එසේ සේවක සංඛ්‍යාව අඩු කළ හැකි ක්‍රම **හතරක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04 යි)

1. ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගැන්වීම
2. වන්දි ලබා දී ඉවත් කිරීම
3. වෙනත් ආයතනයකට යොමු කිරීම
4. නව බඳවා ගැනීම් නතර කිරීම
5. නැවත පුහුණුව ලබා දී වෙනත් රැකියාවලට යොමු කිරීම

*නම් කිරීමට ලකුණු 1/2 x 4 ලකුණු 02 යි*

*පැහැදිලි කිරීමට ලකුණු 1/2 x 4 ලකුණු 02 යි*

(v) පහත දැක්වෙන්නේ ආයතනයක වෙළෙඳ ගිණුමෙන් උපුටාගත් දත්ත කිහිපයකි.

| | රු. | රු. |
|---|---|---|
| විකුණුම් | | 500 000 |
| ආරම්භක තොගය | 80 000 | |
| ගැනුම් | 300 000 | |
| | 380 000 | |
| අවසාන තොගය | (120 000) | 260 000 |

ඉහත දත්ත ඇසුරෙන් ලබා ගත හැකි තොරතුරු **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(මුළු ලකුණු 20 යි)

v.

1. විකුණුම් පිරිවැය
2. දළ ලාභය
3. දළ ලාභ අනුපාතය
4. තොග පිරිවැටුම් සීඝ්‍රතාවය/ අනුපාතය
5. තොග පිරිවැටුම් කාලය

*ලකුණු 1 x 4 - ලකුණු 04 යි*

**8.** (i) (අ) තොරතුරු කළමනාකරණ තාක්ෂණය යනුවෙන් අදහස් කරන්නේ කුමක් දැ'යි විස්තර කරන්න.
(ආ) තොරතුරු තාක්ෂණය භාවිතයෙන් ආයතනයකට ලබා ගත හැකි වාසි **හතරක්** විස්තර කරන්න.
(ලකුණු 04 යි)

(අ) 1. ආයතනයක් සතු පරිගණක තාක්ෂණය හා සන්නිවේදන තාක්ෂණය මැනවින් හසුරුවමින් තොරතුරු සම්පත කාර්යක්ෂමව හා ඵලදායී භාවිත කිරීමේ දී ක්‍රියාවලිය තොරතුරු කළමනාකරණ තාක්ෂණයයි.

*ලකුණු 02*

(ආ) 1. වඩා නිවැරදි තීරණ ගත හැකි වීම
2. කටයුතුවල වැරදි අවම වීම
3. ක්‍රියාවලි කාර්යක්ෂමව සිදු කර ගත හැකි වීම
4. ක්‍රියාවලිය සඵලදායීව සිදු කරගත හැකි වීම
5. නිමැවුම්වල ගුණාත්මක භාවය ඉහළ යාම
6. තොරතුරු සඳහා ඉතා විශාල ගබඩා ධාරිතාවක් පැවතීම
7. පිරිවැය අඩු වීම
8. තරගයට මුහුණ දිය හැකි වීම
9. සන්නිවේදන ක්‍රියාවලිය පහසු වීම
10. පාරිභෝගිකයන් හෝ සේවාදායකයින් වෙත පහසුවෙන් ප්‍රවේශ විය හැකි බව
11. අන්තර්ජාතික වෙළෙඳාම ප්‍රසාරණය වීම

*ලකුණු 1/2 x 4 - ලකුණු 02 යි*

(ලකුණු 04 යි)

(ii) (අ) ව්‍යාපාරිකයෙක් තම ව්‍යාපාර කටයුතු සඳහා අන්තර්ජාලය භාවිත කිරීමට අදහස් කරයි. අන්තර්ජාලය භාවිත කිරීමෙන් ඔහුගේ ආයතන කටයුතු පහසු කර ගත හැකි ආකාර **හතරක්** විස්තර කරන්න.
(ආ) වලාකුළු (CLOUD) තාක්ෂණය භාවිත කිරීමෙන් ආයතනයකට ලබාගත හැකි වාසි **දෙකක්** සඳහන් කරන්න.
(ලකුණු 04 යි)

(අ) 1. නිෂ්පාදිත ප්‍රවර්ධනය පහසු වීම
2. සේවක ආකර්ෂණය පහසු වීම
3. වෙළෙඳ ගනුදෙනු කාර්යක්ෂමව සිදු කළ හැකි වීම/ වෙළෙඳපොල සොයා ගැනීමට හැකි වීම
4. දත්ත ගබඩා කර තබා ගත හැකි වීම
5. සන්නිවේදන කටයුතු පහසුවෙන් කළ හැකි වීම/ ක්ෂණිකව තොරතුරු ලබා ගැනීමට හැකි වීම

6. ව්‍යාපාර කටයුතු බාහිර පාර්ශවයන් ට පවරා සිදු කළ හැකි වීම
7. ව්‍යාපාර කටයුතු අධීක්ෂණය හා නියාමනය පහසු වීම
8. G.P.S. තාක්ෂණය භාවිත කිරීමෙන් ව්‍යාපාර කටයුතු පහසු කර ගත හැකි වීම
9. ජංගම සේවක පිරිසක් පවත්වා ගත හැකි වීම
10. පිරිවැය අඩු කර ගැනීමට හැකි වීම
11. කඩදාසි භාවිතය අවම කර ගත හැකි වීම
12. විද්‍යුත් තැපෑල භාවිතයට ඇති හැකියාව

*ලකුණු 1/2 x 4 - ලකුණු 02 යි*

(ආ)

1. අන්තර් ජාලයට පිවිසීමට උපකරණ ඇති ඕනෑම ස්ථානයක දී ලිපිගොනුවකට ඇතුල් විය හැකි වීම
2. අන්තර්ජාල සැපයුම්කරුවකු හෝ විශාල පරිගණක පද්ධතියක් අනවශ්‍ය වීම
3. දත්ත පද්ධති නඩත්තු කිරීමේ පිරිවැය අඩු වීම
4. තාක්ෂණික හා විදුලිය ඇනහිටීම් ආදී හේතු නිසා දත්ත පද්ධතියට හානි සිදු නොවීම

*ලකුණු 1/2 x 4 - ලකුණු 02 යි*

(iii) ව්‍යාපාර සැලැස්මේ අලෙවි සැලසුමට ඇතුළත් කළ යුතු ප්‍රධාන උපාය මාර්ග මොනවා ද? (ලකුණු 04 යි)

1. නිෂ්පාදිත උපාය මාර්ග
2. මිල උපාය මාර්ග
3. බෙදා හැරීමේ උපාය මාර්ග
4. ප්‍රවර්ධන උපාය මාර්ග

*ලකුණු 1 x 4 - ලකුණු 4 යි*

(iv) මුදල් ප්‍රවාහ ප්‍රකාශයක් සකස් කිරීමේ වැදගත්කම පැහැදිලි කිරීමට කරුණු **දෙකක්** දක්වා, ව්‍යාපාරයක මුදල් ගලායාමට අදාළ අයිතම **තුනක්** ලියන්න. (ලකුණු 04 යි)

1. අනාගත කාලච්ඡේදයක් තුල දී ව්‍යාපාරයට මුදල් ගලා ඒම් සහා ගලා යෑම් පුරෝකතනය කළ හැකි වීම
2. කාලච්ඡේදය අවසානයේ මුදල් ශේෂය පුරෝකතනය කළ හැකි වීම
3. මුදල් ගලා ඒම් සහ ගලා යෑම්වල ප්‍රවණතා හා රටා කලින් හඳුනා ගත හැකි වීම
4. මුදල් ලබාගත හැකි හා මුදල් යෙදවිය යුතු මාර්ග පිළිබඳව කලින් සැලසුම් කර ගත හැකි වීම

*ලකුණු 1/2 x 2 - ලකුණු 03 යි*

*අයිතම*

1. ඉඩම් හා ගොඩනැගිලි මිලට ගැනීම්
2. යන්ත්‍ර හා උපකරණ මිලට ගැනීම්
3. අමුද්‍රව්‍ය මිලට ගැනීම්
4. අලෙවි වියදම්
5. පරිපාලන වියදම්
6. ණය වාරික ගෙවීම්
7. ආදායම් බදු ගෙවීම්
8. ණය පොලී ගෙවීම්

*අයිතම 3 කට ලකුණු 01 යි*
*අයිතම 2 ක් නම් ලකුණු 1/2 යි*
*අයිතම එකක් නම් ලකුණු නැත*

(v) සමන් දැනට කරගෙන යනු ලබන ව්‍යාපාරයට අමතරව සත්ත්ව ගොවිපළක් ආරම්භ කිරීමට අපේක්ෂා කරයි. ඒ සඳහා ව්‍යාපෘති වාර්තාවක් සකස් කිරීමට ඔබට බාර දී ඇත. එම ව්‍යාපෘති වාර්තාවේ සාරාංශය තුළ ඔබ විසින් ඇතුළත් කරනු ලබන්නේ මොනවා දැ'යි සඳහන් කරන්න. (ලකුණු 04 යි)
(මුළු ලකුණු 20 යි)

1. ඇස්තමේන්තුගත පිරිවැය
2. ආදායම් ප්‍රකාශය
3. මුදල් ප්‍රවාහ ප්‍රකාශය
4. ණය ආපසු ගෙවීමේ සටහන
5. ඇස්තමේන්තුගත ශේෂපත්‍රය

යනාදිය පිළිබඳ තොරතුරු

කරුණු 4 ට ලකුණු 04 යි

WWW.PastPapers.WiKi


Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Paper Bank